## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## 2026 මාර්තු 12 දින මහා සභා රැස්වීමේ වාර්තාව

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2026.03.12 දින පෙ.ව 10.00 ට පමණ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පවත්වන්නට යෙදුනු ගරු මහා සභාවේ රැස්වීම් වාර්තාවයි.

1. ගරු සභාපති - ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා
2. ගරු උප සභාපති - ජේ.එම්.එච්. ජයවර්ධන මහතා
3. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - ආර්.ජී. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එස්. මොහොමඩ් රසියා සකාෆ් මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. නිමල් විජේසේකර මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්. මහිලාල් සුමිත් කුමාර මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ජී. මධුෂ සචිත් කුමාර මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.වී. රුචිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වයි.ජී. සුදත් හේමන්ත මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නීල් නෙල්ෂන් කඩදර මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී. චූලංග අනුපිය අධිකාරී මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ජී. උපාලි සිරිවර්ධන මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. රත්නපාල පීරිස් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී. ධම්මික සනත් රත්නසේකර මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සුමිත් රෝහාන් ප්‍රියදර්ශන මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඩබ්.ජී. සරත් සිරිවර්ධන මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ජී. චන්ද්‍රානී හේමලතා මහත්මිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී. ප්‍රභාෂිනි රුක්ෂි මහත්මිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජී ඉන්දික ජයලත් වේරගොඩ මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ජී. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්. අමිත මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම් . සුසන්ත අජිත් කුමාර මහතා

**නොපැමිණීම**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා

**ආගම සිහි කිරීම**

පළමුව ආගම සිහි කිරීමෙන් පසුව ගරු මහා සභාවට පැමිණි සියළු දෙනා ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා බව පවසමින් මහා සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

**ජාතික විරුවන් සිහි කිරීම**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විනාඩියක නිශ්ශබ්දතාවයක් ගත කරමින් ජාතික විරුවන් සිහි කරන ලදි.

**අ. පසුගිය රැස්වීමේ වාර්තාව සහා සම්මත කිරීම**

2026.02.12 දින ගරු මහා සභාවේ වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්,එය කියවූවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුවත් කරන ලදි.

කිසිදු සංශෝධනයක් ඉදිරිපත් නොවූ බැවින්,2026.02.12 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට,ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් යෝජනා කරන ලදි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර,2026.02.12 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**ආ. සභාපතිතුමාගේ නිවේදන වාරය**

1. 2026 බක්මහ උළෙල වෙනුවෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සහ රාජ්‍ය ආයතන,පෞද්ගලික ආයතන සියල්ල ඒකාබද්ධව 2026.අප්‍රේල් මාසයේ 18 වැනි දින අලුත් අවුරුද්ද වෙනුවෙන් උත්සවයක් සංවිධානය කිරීමට තීරණය කර ඇති බවත්,රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගණයෙහි මෙම උත්සවය පැවැත්වීමට තීරණය කර ඇති බවත්,මේ සඳහා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සියලු දෙනාටම ඉතාමත් ආදරයෙන් ආරාධනා කරන බවත්, එමෙන්ම මෙය සාර්ථක කර ගැනීමට සියලු දෙනාගේම සහාය ලබාදෙන ලෙස ගෞරවනීයව ඉල්ලීම් කරන බව දන්වන ලදි.
2. 2026 වසරේ දී 5 වසර ශිෂ්‍යත්වයට මුහුණ දෙන මේ ප්‍රදේශයේ ආදරණීය දරු දැරියන් වෙනුවෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සම්බන්ධ වී පුස්තකාල ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පුස්තකාලයේ මැදිහත්වීම යටතේ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට තීරණය කර ඇති බවත්, මාර්තු 14 වෙනි සෙනසුරාදා උදේ 8.30-1.30 දක්වා රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී සම්මන්ත්‍රණය පැවැත්වෙන බවත්,මේ සඳහා ඉමාෂි ප්‍රකාශන ආයතනය,යුනිලිවර් ආයතනය,මහජන බැංකුව අනුග්‍රහය දක්වන බවද,මංජුල මහේන්ද්‍ර ගුරුතුමා සම්පත් දායකත්වය ලබා දෙන බවද එතුමන් කොළඹ කලාපයේ ගුරු උපදේශකවරයෙකු ලෙස කටයුතු කරන බවද මේ සඳහා දරුවන්ට ආරාධනා කර ඇති බවද මෙය නොමිලයේ පවත්වන සම්මන්ත්‍රණයක් බවද දන්වන ලදි.
3. ඉදල්පොල කසල කළමනාකරණ ඒකකය සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය පුළුල් කිරීමේ වැඩසටහන් යටතේ එල්. ආර් .සී.ඉඩම් අක්කර තුනක් ඉල්ලීම් කර තිබුනු බවද එම ඉඩම පිළිබඳ පසුගිය කාලසීමාව තුළම සාකච්ඡා කරමින් සිටි බවද නමුත් සාර්ථක වී නොතිබුනු බවත් ලබන සතියේ දී භුක්තිය භාර දීම සඳහා එම ආයතනයෙන් අවස්ථාව ලබා දෙන බව, අප වෙත තොරතුරුලබා ගැනීමට හැකි වුණු බවද එය සතුටින් දැනුම්දීමට කැමති බව දක්වන ලදි.
4. රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙ ප්‍රතිපාදන යටතේ රුපියල් එක්කෝටි අනූ එක් ලක්ෂ හැටදහසක් ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් සකස් කිරීමට මුදල් වෙන් වී ඇති බවත්,ඒ සඳහා ඉඹුලාන තෝරගෙන ඇති බවද එම ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීමක් සිදු කර ඇති බවද ඒ සම්බන්ධව හදිසි යෝජනාවක් අද සභාවට ඉදිරිපත් කර ඇති බවද දන්වන ලදි.
5. මාර්තු 16 වැනි සඳුදා දින ජයිකා ආයතනයේ කණ්ඩායමක් අපේ ආයතනයේ දී විශේෂ වැඩමුළුවක් පවත්වන්න තීරණය කර ඇති බවද, මෙය මළාපවාහන පද්ධති හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සේවා පිළිබඳ වැඩමුළුවක් වන බවද මෙහිදී ජයිකා ආයතනයේ තිහක වැනි කණ්ඩායමක් අප ආයතනය වෙත පැමිණෙන බව දැනුම් දී ඇති බවද දක්වන ලදි.
6. අවුරුදු උත්සවය පිළිබඳව මුලින් සඳහන් කළ ද බක්මහ උළෙල පැවැත්වීම සම්බන්ධයෙන් මේ සඳහා අප සියලු දෙනා කණ්ඩායමක් ලෙස එකතුවෙලාවැඩසටහන සිදු කරමු යන්නත් , කැමති අයට මේ සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් එකතු වෙලා කමිටුවක්ලෙස වැඩ කරමින් මෙම වැඩසටහන සාර්ථක කරගන්න එකතු වෙමු යන පොදු ඉල්ලීම සිදු කරන බවද සංවිධායක කමිටුවක්ලෙස අපි හෙට දින රැස් වී හෙට දෙකට රැස්වීම පැවැත්වෙන බවද දක්වන ලදි.

**ඇ. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් , ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.පී. දිනිඳු සම්පත් කුලතුංග මහතා ගරු මහ සභාව සඳහා නොපැමිණෙන බව දන්වා සිටින ලදි. මෙම නොපැමිණීම අනුමත කරන බවට ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා විසින් ප්‍රකාශ කරන ලදි.

**ඈ. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි සභාවට ඉදිරිපත් කිරීම**

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී. ධම්මික සනත් රත්නසේකර මහතා විසින් ,විහාරාධිකාරී,පූජ්‍ය රාජාංගනයේ ධම්මදේව හිමි,ශ්‍රී විජයාරාමය,පල්ලෙකණුගල,අම්තිරිගල යන ලිපිනයෙන් "වාර්ෂික පෙරහැර මංගල්‍ය සඳහා මාවත සකස් කිරීමට සභාව සතු ජේ.සී.බී යන්ත්‍රය ලබා ගැනීම හා මාර්ගයේ ඇති වීදි ලාම්පු සකස් කර ගැනීම සඳහා" ලෙස ලිපියක් ලබා දෙන ලදි.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.නිමල් විජේසේකර මහතා විසින්,ග්‍රාම සංවර්ධන සමිතිය,දන්නොරුව,රුවන්වැල්ල ලිපිනයෙන්, " දන්නොරු රත්තාගල ගම්දෙක යා කරන පාර කපා ගැනීම සඳහා බැකෝ යන්ත්‍රය ලබා ගැනීම" ලෙස ලිපියක් ලබා දෙන ලදි.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -පී.ඒ. චන්ද්‍රානී හේමලතා මහත්මිය විසින් ,ටී.රාජේන්ද්‍රම්,අංක05,ටුවින්කිම් ඈම් වත්ත,දකුණු අම්තිරිගල යන ලිපිනයෙන් " නිවසට විදුලිය ලබා ගැනීම සම්බන්ධවයි" ලෙස ලිපියක් ලබා දෙන ලදි.

**ඉ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**-නැත-**

**ඊ. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතාගේ යෝජනා,</u>**

**<u>ඊ - 01</u>**

2025.10.13 දින ඊ 23 සභා යෝජනාව මඟින් ළමා හා කාන්තා කටයුතු සම්බන්ධ වන උපදේශන කාරක සභාව පත් කිරීම සඳහා යොමු කළ යෝජනාව පහත පරිදි සංශෝධනය කර නැවත ගරු මහ සභාවට යොමු කිරීමේ යෝජනාව.

කමිටු සංයුතිය

- ජී.වී රුවිනි ලක්ෂ්මි ප්‍රියදර්ශනී මිය - ගරු ප්‍රා .සභා මන්ත්‍රීනී - කමිටු සභාපති
- එම්.බී.ස්වර්ණතිලකා මිය - ගරු ප්‍රා. සභා මන්ත්‍රීනි -කමිටු සාමාජික
- ඩී.එම්.එස් කුමාරි දිසානායක මිය - ගරු ප්‍රා.ස මන්ත්‍රීනී -කමිටු සාමාජික
- පී.එම් අයි කුසුම්ලතා මිය -ගරු ප්‍රා.ස මන්ත්‍රීනී - කමිටු සාමාජික
- ආර්.ඒ.සී.පී කාන්ති මිය - ගරු ප්‍රා.ස මන්ත්‍රීනී - කමිටු සාමාජික
- පී.ඒ.සී හේමලතා මිය - ගරු ප්‍රා.ස මන්ත්‍රීනී - කමිටු සාමාජික
- ඩී.පී රුක්ෂි මිය -ගරු ප්‍රා.ස මන්ත්‍රීනී -කමිටු සාමාජික
- කේ.ඩී.එස්.ආර්.කුමාරි මිය-කමිටු සාමාජික
- එස්.ජී.චලනි ජයනිකා මිය -කමිටු සාමාජික

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා විසින් මෙම යෝජනාවෙහි " 2025.10.13 දින ඊ 23 සභා යෝජනාව " යන කොටස " 2025.10.13 දින ඊ 22 සභා යෝජනාව " ලෙස වෙනස් විය යුතු බව පෙන්වා දෙන ලදි.එමෙන්ම මෙම කමිටුවේ සභාපතීත්වය කමිටුව රැස් වී යොදා ගැනීම සුදුසු වන බවද දක්වන ලදි.
මෙහිදී ගරු සභාපතිතුමා විසින් සෑම කමිටුවකම සභාපති නම් කිරීමක් සිදු කළ නිසා මෙහිදී ද එලෙස සිදු කර ඇති බව දක්වන ලදි.එමෙන්ම එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, මෙම යෝජනාවට අදාලව 2025.10.13 ඊ 22 සභා යෝජනාව ලෙස සංශෝධන වෙමින් ,ඉහත දක්වා ඇති කමිටු සංයුතිය අනුව ක්‍රියාත්මක කිරීම සුදුසු බව, ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 02</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/04/01/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ,මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි සේවකයන් තිදෙනකු සෞඛ්‍ය කම්කරු සේවයේ යොදවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවත්,ඒ අනුව සෞඛ්‍ය කම්කරු තනතුර වෙනුවෙන් සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සහිත W.A.P.N. වික්‍රමාරච්චි මයා සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීම් පදනමින් 2026.03.01 දින සිට 2026.05.31 දක්වා කාලයට සේවයේ යෙදවීම සුදුසු බවත්,ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්,යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/04/01/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ,මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි සේවකයන් තිදෙනකු සෞඛ්‍ය කම්කරු සේවයේ යොදවා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවත්,ඒ අනුව සෞඛ්‍ය කම්කරු තනතුර වෙනුවෙන් සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සහිත W.A.P.N. වික්‍රමාරච්චි මයා සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීම් පදනමින් 2026.03.01 දින සිට 2026.05.31 දක්වා කාලයට සේවයේ යෙදවීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 03</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2022.03.18 දිනැති ලිපිය මඟින් දෛනික කුලී ගෙවීම් පදනම මත සෞඛ්‍ය කම්රුවන් බඳවා ගැනීමට ලබා දී තිබූ අනුමැතිය අනුව E.M.V.D එදිරිසිංහ මයා සේවයට බඳවාගත් අතර,සේවා අවශ්‍යතාව හා අධ්‍යාපන සුදුසුකම් සලකා ඔහු රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලය වෙත අනියුක්ත කර සේවයේ යොදවන ලදි.ඔහුගේ ඉල්ලීම අනුව 2026.03.01 දින සිට මෙම ආයතනයේ සේවයෙන් ඉවත්ව ඇති අතර,ඔහු වෙනුවට එම රාජකාරී ඉටු කිරීමට අදාල අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සහිත අයෙකු බඳවා ගැනීම සුදුසු වේ .ඒ අනුව අදාල අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති H.P.S.I දර්ශිකා මෙය 2026.03.01 දින සිට 2027.02.28 දක්වා ඉහත තනතුර වෙනුවෙන් සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවයේ යෙදවීම සුදුසු බවත් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ආර්. සමන් ඉන්දික දයාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2022.03.18 දිනැති ලිපිය මඟින් දෛනික කුලී ගෙවීම් පදනම මත සෞඛ්‍ය කම්රුවන් බඳවා ගැනීමට ලබා දී තිබූ අනුමැතිය අනුව E.M.V.D එදිරිසිංහ මයා සේවයට බඳවාගත් අතර,සේවා අවශ්‍යතාව හා අධ්‍යාපන සුදුසුකම් සලකා ඔහු රුවන්වැල්ල මධ්‍යම පුස්තකාලය වෙත අනියුක්ත කර සේවයේ යොදවන ලදි.ඔහුගේ ඉල්ලීම අනුව 2026.03.01 දින සිට මෙම ආයතනයේ සේවයෙන් ඉවත්ව ඇති අතර,ඔහු වෙනුවට එම රාජකාරී ඉටු කිරීමට අදාල අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සහිත අයෙකු බඳවා ගැනීම සුදුසු වේ .ඒ අනුව අදාල අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති H.P.S.I දර්ශිකා මෙය 2026.03.01 දින සිට 2027.02.28 දක්වා ඉහත තනතුර වෙනුවෙන් සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවයේ යෙදවීම සුදුසු බවත්, ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 04</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු Y.B.K.S ද කොස්තා මයාගේ සේවා ගිවිසුම 2026.04.06 දිනෙන් අවසන් වන බැවින් ඔහුගේ 2026.02.27 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇත්තේ මෙම ආයතනයේ කොන්දේසි වලට යටත්ව ඉදිරියටත් සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කිරීමට එකඟ බැවින් සේවා ගිවිසුම දීර්ඝ කරදෙන ලෙසයි.මේ සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වාර්තා කර ඇත්තේ මොහුගේ වැඩ,පැමිණීම හා හැසිරීම සතුටුදායක වන අතර රුවන්වැල්ල නගරයේ කසළ කළමනාකරණ කටයුතු සඳහා මොහුගේ සේවය අවශ්‍ය බැවින් සේවා ගිවිසුම දීර්ඝ කිරීම සුදුසු බවයි.ඒ අනුව සෞඛ්‍ය කම්කරු Y.B.K.S ද කොස්තා මයාගේ සේවා ගිවිසුම2026.04.07-2026.07.06 දක්වා කාලයට දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු Y.B.K.S ද කොස්තා මයාගේ සේවා ගිවිසුම 2026.04.06 දිනෙන් අවසන් වන බැවින්, සෞඛ්‍ය කම්කරු Y.B.K.S ද කොස්තා මයාගේ සේවා ගිවිසුම2026.04.07-2026.07.06 දක්වා කාලයට දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>**ඊ - 05**</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු ,වැඩ ක්ෂේත්‍ර කම්කරු ,ආදාහනාගාර සහයක යන තනතුරු වල දෛනික දීමනා ගෙවීමේ පදනම් මත සේවා අවශ්‍යතාව යටතේ සේවයේ යොදවාගෙන ඇති කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනට ගෙවන දෛනික දීමනාව වන්නේ රු.1318.00කි.මෙම දීමනාව 2022.06.01 දින සිට ගෙවනු ලබයි.වර්තමානයේ රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම රා.ප.ච.10/2025 පදනම් කරගෙන සිදු කරනු ලබන අතර රු.1318.00ක දෛනික දීමනාව ගෙවා ඇත්තේ රා.ප.ච.03/2016 පදනම් කරගෙන වේ.නමුත් වර්තමානයේ ක්‍රියාත්මක රා.ප.ච.10/2025 පදනම් කරගෙන සේවා ගිවිසුම් මත කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය වී නොමැති අතර පවතින ආර්ථික තත්වය හා වැටුප් පරිමාණ පදනම් කරගෙන වැටුප් සංශෝධනය කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය වේ .විශේෂයෙන්ම මේ වන විට පෞද්ගලික ආයතන මඟින්ද දෛනිකව රු.2000.00ඉක්මවා කම්කරු කුලියක් ගෙවන අතර ,දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව (මේ වන විට නිකුත් කර ඇති තෙවන කාර්තු වාර්තාව අනුව)නුපුහුණු කම්කරු කුලිය දිනකට රු.2500.00කි.එමෙන්ම ආසන්නයේ පිහිටි වෙනත් පළාත් පාලන ආයතන වලද මෙම තනතුරුවල යෙදී සිටින කාර්ය මණ්ඩලයේ දෛනික දීමනාව රු.1318.00කට වඩා ඉහල මට්ටමක පවතින බැවින් ,මෙම සේවාව තුළ යෙදී සිටින පිරිස අතර අසමානතාවක් ඇති වී තිබේ.එබැවින් දෛනික සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන්ගෙන් වඩා වැඩි කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා ගැනීමටත් ,සේවකයින් විටින් විට ආයතනය හැර යාම වලක්වා ගැනීමටත් වර්තමානයේ ක්‍රියාත්මක රා.ප.ච 10/2025 හි 2026.01.01 දිනට PL-01 කාණ්ඩයේ III ශ්‍රේණියට නියමිත ආරම්භක වැටුප වන රු.38863.00 ක මුදල හා රු.17800.00ක ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන දෛනිකව රු.1888.00 බැගින් වු දෛනික දීමනාවක් සේවා ගිවිසුම් මත PL-01 කාණ්ඩයේ තනතුරුවල සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් වෙත 2026.03.01 දින සිට ගෙවීම සුදුසු බවත්,ඒ වෙනුවෙන් මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්,රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු ,වැඩ ක්ෂේත්‍ර කම්කරු ,ආදාහනාගාර සහයක යන තනතුරු වල දෛනික දීමනා ගෙවීමේ පදනම් මත සේවා අවශ්‍යතාව යටතේ සේවයේ යොදවාගෙන ඇති කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනට ගෙවන දෛනික දීමනාව වන්නේ රු.1318.00කි.මෙම දීමනාව 2022.06.01 දින සිට ගෙවනු

ලබයි.වර්තමානයේ රාජ්‍ය සේවයේ වැටුප් ගෙවීම රා.ප.ච.10/2025 පදනම් කරගෙන සිදු කරනු ලබන අතර රු.1318.00ක දෛනික දීමනාව ගෙවා ඇත්තේ රා.ප.ච.03/2016 පදනම් කරගෙන වේ.නමුත් වර්තමානයේ ක්‍රියාත්මක රා.ප.ච.10/2025 පදනම් කරගෙන සේවා ගිවිසුම් මත කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය වී නොමැති අතර පවතින ආර්ථික තත්වය හා වැටුප් පරිමාණ පදනම් කරගෙන වැටුප් සංශෝධනය කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය වේ .විශේෂයෙන්ම මේ වන විට පෞද්ගලික ආයතන මහින්ද දෛනිකව රු.2000.00ඉක්මවා කම්කරු කුලියක් ගෙවන අතර ,දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව අනුව (මේ වන විට නිකුත් කර ඇති තෙවන කාර්තු වාර්තාව අනුව)නුපුහුණු කම්කරු කුලිය දිනකට රු.2500.00කි.එමෙන්ම ආසන්නයේ පිහිටි වෙනත් පළාත් පාලන ආයතන වලද මෙම තනතුරුවල යෙදී සිටින කාර්ය මණ්ඩලයේ දෛනික දීමනාව රු.1318.00කට වඩා ඉහල මට්ටමක පවතින බැවින් ,මෙම සේවාව තුළ යෙදී සිටින පිරිස අතර අසමානතාවක් ඇති වී තිබේ.එබැවින් දෛනික සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන්ගෙන් වඩා වැඩි කාර්යක්ෂම හා ඵලදායි සේවයක් ලබා ගැනීමටත් ,සේවකයින් විටින් විට ආයතනය හැර යාම වලක්වා ගැනීමටත් වර්තමානයේ ක්‍රියාත්මක රා.ප.ච 10/2025 හි 2026.01.01 දිනට PL-01 කාණ්ඩයේ III ශ්‍රේණියට නියමිත ආරම්භක වැටුප වන රු.38863.00 ක මුදල හා රු.17800.00ක ජීවන වියදම් දීමනාව පදනම් කරගෙන දෛනිකව රු.1888.00 බැගින් වු දෛනික දීමනාවක් සේවා ගිවිසුම් මත PL-01 කාණ්ඩයේ තනතුරුවල සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් වෙත 2026.03.01 දින සිට ගෙවීම සුදුසු බවත්,ඒ වෙනුවෙන් මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත් ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ - 06</u>**

2025.08.14 දින ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා අංක ඊ 21 යෝජනාව හා බැඳේ.ඒ අනුව අඩු ආදායම්ලිහී පවුල් සඳහා වැසිකිලි පහසුකම් ලබා දීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් වැසිකිලි පෝච්චි හා ආබාධිත අඩු ආදායම්ලාභීන් සඳහා කොමඩ් වර්ගයේ වැසිකිලි පොච්චි මිලට ගෙන ලබා දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට සිදු කරන යෝජනාව.මේ සඳහා ඇමුණුමේ සඳහන් අඩු ආදායම්ලාභීන් ඉල්ලුම්කර ඇත.(ඇමුණුම් අංක 01)

වැසිකිළි පෝච්චි ඉල්ලුම් කර ඇති අඩුආදායම්ලාභීන්ගේ ලේඛනය

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 1. | ජී.ජී.බුද්ධි මධුෂාන් චන්ද්‍රතිලක මයා (ආබාධිත) | බී./201/1,අඹගහවත්ත,<br>දොරණුව. |
| 2. | බී.ටී.කීර්ති රණසිංහ මයා | ඊ/237/බී.,වැද්දාවල,<br>ගෝනගල,රුවන්වැල්ල. |
| 3. | හාරුප් මොහොමඩ් ආෂි මයා | ඒ.69/2,ඉහළගම ,කන්නත්තොට. |
| 4. | ඒ.ඒ.පුංචි නෝනා මිය | අන්නාසිවත්ත,<br>උතුරු ගෝනගල,වහකුල,රුවන්වල්ල. |
| 5. | ඩී.පී.කරුණාවතී මිය | බංගලි වත්ත, ඉඹුලාන. |
| 6. | කේ.පී.ධම්මිකා මිය | බොගමුව, රුවන්වැල්ල. |
| 7. | ආශා විනෝදනී මිය | බොගමුව, රුවන්වැල්ල. |

| | | |
|---|---|---|
| 8. | ටී.ඒ තාරක සම්පත් මයා | බොගමුව, රුවන්වැල්ල. |
| 9. | ඩී.වී.ඉමංසා තිලක්ෂනී මිය | බොගමුව, රුවන්වැල්ල. |
| 10. | බී.ආර්.ස්වර්ණලතා ජයසිංහ මිය | කන්දේවත්ත,මොරාවත්ත,රුවන්වැල්ල. |
| 11. | කේ.ඩී.ශ්‍රියානි කුමාරි මිය | කන්දේවත්ත,මොරාවත්ත,රුවන්වැල්ල. |
| 12. | යූ.පී.අනිල් ප්‍රබෝධ ඥානරත්න මයා | ඊ.15/3,උඩත්තව,කන්නත්තොට. |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ඒ. චන්ද්‍රානී හේමලතා මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාවෙහි අනු අංක 11 හි ලිපිනය“කේ.ඩී.ශ්‍රියානි කුමාරි මිය,ඒ/9/බී දන්ගහදෙනිය,අම්තිරිගල උතුර” ලෙස වෙනස් විය යුතු බව දක්වන ලද අතර මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.08.14 දින ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා අංක ඊ 21 යෝජනාව හා බැඳේ.ඒ අනුව අඩු ආදායම්ලිභී පවුල් සඳහා වැසිකිලි පහසුකම් ලබා දීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් වැසිකිලි පෝච්චි හා ආබාධිත අඩු ආදායම්ලාභීන් සඳහා කොමඩ් වර්ගයේ වැසිකිලි පොච්චි මිලට ගෙන ලබා දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

සංශෝධන යෝජනා ලෙස

**ඊ - 07**

2025.11.11 දින පැවති ගරු මහ සභාවේ හදිසි යෝජනා යටතේ ඊ 14 ලෙස සඳහන් යෝජනාවෙහි “නොමිලේ නිල ඇඳුමක් ලබා දීමට” යන කොටස “නොමිලේ ටීෂර්ට් දෙකක් ලබා දීමට ” ලෙස සංශෝධනය විය යුතුය.ඒ අනුව මෙහි දක්වා ඇති ආකාරයට මෙම යෝජනාව සංශෝධනය කර ගැනීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරන යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.11.11 දින පැවති ගරු මහ සභාවේ හදිසි යෝජනා යටතේ ඊ 14 ලෙස සඳහන් යෝජනාවෙහි “නොමිලේ නිල ඇඳුමක් ලබා දීමට” යන කොටස “නොමිලේ ටීෂර්ට් දෙකක් ලබා දීමට ” ලෙස සංශෝධනය විය යුතුය.ඒ අනුව මෙහි දක්වා ඇති ආකාරයට මෙම යෝජනාව සංශෝධනය කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඊ -08**

2026 වර්ෂය සඳහා අම්තිරිගල මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම විධිමත් කිරීමේ අරමුණින් දැනට පුවත්පත් සපයන P.K.සුසන්ත ප්‍රියලාල් මයාගෙන් පුවත්පත් ලබා ගැනීම නවතා 2026.02.16 දින සිට නව සැපයුම්කරු වන L.M.A.ටිරාෂා නිල්මිණි(චන්දන පොත්හල-කිරිදිවැල)සැපයුම්කරුගෙන් පුවත්පත් ලබා ගැනීමට සහ 2026.02.16 දින සිට 2026 වසරේ පුවත්පත් ලැබීම් සඳහා එම සැපයුම්කරුට ගෙවීම් කිරීමටත් ගරු මහ සභාවෙන් අවසර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.වී. රුවිනි ලක්ෂ්මී ප්‍රියදර්ශිනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2026 වර්ෂය සඳහා අම්තිරිගල මහජන පුස්තකාලයට පුවත්පත් සැපයීම විධිමත් කිරීමේ අරමුණින් දැනට පුවත්පත් සපයන P.K.සුසන්ත ප්‍රියලාල් මයාගෙන් පුවත්පත් ලබා ගැනීම නවතා 2026.02.16 දින සිට නව සැපයුම්කරු වන L.M.A.විරාෂා නිල්මිණි(වන්දන පොත්හල-කිරිදිවැල)සැපයුම්කරුගෙන් පුවත්පත් ලබා ගැනීමත්, 2026.02.16 දින සිට 2026 වසරේ පුවත්පත් ලැබීම් සඳහා එම සැපයුම්කරුට ගෙවීම් කිරීමත්, සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ-09</u>**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතුව සිටි එච්.ඒ.ලාල් ප්‍රේමතිලක මයා ඔහුගේ පෞද්ගලික අවශ්‍යතාව හේතුවෙන් 2026.02.01 දින සිට මෙම ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇත.එමෙන්ම මෙම ආයතනයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු කේ.ජී. පද්මසිරි මයා 2026.06.01 දින සිට විශ්‍රාම ගැනීමට නියමිත වන අතර 2026.03.15 දින සිට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට නියමිතව ඇත.ඒ අනුව මෙම තනතුරු වල ඇති වී තිබෙන පුරප්පාඩු ආවරණය කර ගැනීම සඳහා සේවා ගිවිසුම් මත සේවකයකු බඳවා ගැනීම සුදුසු වේ.එබැවින් එච්.ඒ.ලාල් ප්‍රේමතිලක මයා ඉවත් වීමෙන් ඇති වී තිබෙන පුරප්පාඩුව සඳහා ඒ.ජී.කේ .සී.අබේපාල මයා 2026.03.16 දින සිට 2027.03.15 දින දක්වා සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම සුදුසු බවත්,ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්,යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවා ගිවිසුම් මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතුව සිටි එච්.ඒ.ලාල් ප්‍රේමතිලක මයා ඔහුගේ පෞද්ගලික අවශ්‍යතාව හේතුවෙන් 2026.02.01 දින සිට මෙම ආයතනයේ සේවයෙන් ඉවත් වී ඇත.එමෙන්ම මෙම ආයතනයේ වැඩ ක්ෂේත්‍ර කම්කරු කේ.ජී. පද්මසිරි මයා 2026.06.01 දින සිට විශ්‍රාම ගැනීමට නියමිත වන අතර 2026.03.15 දින සිට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගැනීමට නියමිතව ඇත.ඒ අනුව මෙම තනතුරු වල ඇති වී තිබෙන පුරප්පාඩු ආවරණය කර ගැනීම සඳහා සේවා ගිවිසුම් මත සේවකයකු බඳවා ගැනීම සුදුසු වේ.එබැවින් එච්.ඒ.ලාල් ප්‍රේමතිලක මයා ඉවත් වීමෙන් ඇති වී තිබෙන පුරප්පාඩුව සඳහා ඒ.ජී.කේ .සී.අබේපාල මයා 2026.03.16 දින සිට 2027.03.15 දින දක්වා සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම සුදුසු බවත්,ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**<u>ඊ-10</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ සභා අරමුදලින් වැය දරමින් මාස තුනෙන් තුනට සේවය ඛණ්ඩනය වන පරිදි ගිවිසුම අලුත්වන ආකාරයට සේවකයන් තිදෙනකු සෞඛ්‍ය කම්කරු සේවයේ යොදවා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවයි.ඒ අනුව සේවා අවශ්‍යතාව මත මෙම ආයතනය සඳහා එච්.ඒ .ආර්.ලක්ෂාන් මයා 2026.03.14 -2026.06.03 දින දක්වා කාලයට සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සේවයේ යොදවා ගැනීම සුදුසු බවත් ඒ වෙනුවෙන් මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ සහා අරමුදලින් වැය දරමින් මාස තුනෙන් තුනට සේවය බණ්ඩනය වන පරිදි ගිවිසුම අලුත්වන ආකාරයට සේවකයන් තිදෙනකු සෞඛ්‍ය කම්කරු සේවයේ යොදවා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බවයි.ඒ අනුව සේවා අවශ්‍යතාව මත මෙම ආයතනය සඳහා එච්.ඒ .ආර්.ලක්ෂාන් මයා 2026.03.14 -2026.06.03 දින දක්වා කාලයට සේවා ගිවිසුම් මත දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා සේවයේ යොදවා ගැනීම සුදුසු බවත් ඒ වෙනුවෙන් මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

අනතුරුව අද දිනට නියමිත කල් දී ඇති යෝජනා අවසන් වන බැවින් අද දිනට හදිසි යෝජනාවන් ඇති බැවින් එම යෝජනා සභා ගත කිරීම සඳහා යෝජනා කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදි.
ඒ අනුව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් හදිසි යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනාව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
ඒ අනුව ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා ඉදිරිපත් කරන ලදි.
හදිසි යෝජනා
01
**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතාගේ යෝජනා,</u>**
**<u>ඊ -11</u>**
2025.12.11 දින පැවති මහ සභා රැස්වීමේ සභා වාර්තාවේ ඊ 10 දරණ සභා තීරණය සංශෝධනය කර ගැනීම .
එහි සඳහන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව යන කොටස වෙනුවට ඒ පිළිබඳ "කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව සහා සම්මත කර ,ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට " යනුවෙන් සංශෝධනය විය යුතුය.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි යූ.ජී. සුදත් අනුර උඩුමල්වත්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.12.11 දින පැවති මහ සභා රැස්වීමේ සභා වාර්තාවේ ඊ 10 දරණ සභා තීරණය සංශෝධනය කර ගැනීම .
එහි සඳහන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව යන කොටස වෙනුවට ඒ පිළිබඳ "කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව සහා සම්මත කර ,ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට " යනුවෙන් සංශෝධනය කිරීම සුදුසු බවට, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

02
**<u>ඊ -12</u>**
2025.12.11 දින පැවති මහ සභා රැස්වීමේ ,සභා වාර්තාවේ ඊ 11 දරණ සභා තීරණය සංශෝධනය කර ගැනීම.
එහි සඳහන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු ,වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යැම සම්බන්ධයෙන් වන සම්මත අතුරු ව්‍යවස්ථාව යන කොටස වෙනුවට ඒ පිළිබඳව "කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව සහා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට"යනුවෙන් සංශෝධනය විය යුතුය.

මෙම යෝජනාව ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2025.12.11 දින පැවති මහ සභා රැස්වීමේ ,සභා වාර්තාවේ ඊ 11 දරණ සභා තීරණය සංශෝධනය කර ගැනීම.
එහි සඳහන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ දැන්වීම් පුවරු ,වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙන යැම සම්බන්ධයෙන් වන සම්මත අතුරු ව්‍යවස්ථාව යන කොටස වෙනුවට ඒ පිළිබඳව ''කෙටුම්පත් කරන ලද අතුරු ව්‍යවස්ථාව සහා සම්මත කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට''යනුවෙන් සංශෝධනය කිරීම සුදුසු බවට, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

03

**<u>ඊ -13</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් මාස තුනෙන් තුනට බණ්ඩනය වන පරිදි සේවා ගිවිසුම අලුත්වන ආකාරයට සහා අරමුදලින් වැය දැරීමේ පදනමින් සෞඛ්‍ය කම්කරුවන් තිදෙනකු සේවයේ යොදවා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බව දැනුම් දී ඇත.ඒ අනුව සෞඛ්‍ය අංශයේ රාජකාරී කටයුතු සඳහා සේවා ගිවිසුම් මත අංක D/95/A,පොල්වත්තවෙල,මුදුගමුව,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි K.A.D.P.P කුමාරසිංහ මිය 2026.03.16-2026.06.15 දින දක්වා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවත්,ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ,යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/4/1/13-11 හා 2025.12.18 දිනැති ලිපිය මඟින් මාස තුනෙන් තුනට බණ්ඩනය වන පරිදි සේවා ගිවිසුම අලුත්වන ආකාරයට සහා අරමුදලින් වැය දැරීමේ පදනමින් සෞඛ්‍ය කම්කරුවන් තිදෙනකු සේවයේ යොදවා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබා දී ඇති බව දැනුම් දී ඇත.ඒ අනුව සෞඛ්‍ය අංශයේ රාජකාරී කටයුතු සඳහා සේවා ගිවිසුම් මත අංක D/95/A,පොල්වත්තවෙල,මුදුගමුව,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි K.A.D.P.P කුමාරසිංහ මිය 2026.03.16-2026.06.15 දින දක්වා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවත්,ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් , ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

04

**<u>ඊ-14</u>**

දැඩි නියඟය නිසා පානීය ජල ගැටලුවට මුහුණ දී සිටින රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය යොදාගෙන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය මිලට ගෙන බෙදා දීම සඳහා සිදු කරන යෝජනාව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, දැඩි නියඟය නිසා පානීය ජල ගැටලුවට මුහුණ දී සිටින රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය යොදාගෙන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ජලය මිලට ගෙන බෙදා දීම සඳහා සිදු කරන යෝජනාව ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ,ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

05

**ඊ-15**

නො E/52 විජිත සෙවන ,වහකුල,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි H.S.D. කුමාරි ශිෂ්‍යාව කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධිය සම්පූර්ණ කිරීම සඳහා පැය 300 ක පුහුණු කාලයක් සම්පූර්ණ කිරීමට අප ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත.රා.ප.ච 04/2017 ට අනුව එම ශිෂ්‍යාවට ගෙවීම් රහිතව ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාවයි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, නො E/52 විජිත සෙවන ,වහකුල,රුවන්වැල්ල ලිපිනයේ පදිංචි H.S.D. කුමාරි ශිෂ්‍යාව කැලණිය විශ්ව විද්‍යාලයේ උපාධිය සම්පූර්ණ කිරීම සඳහා පැය 300 ක පුහුණු කාලයක් සම්පූර්ණ කිරීමට අප ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත.රා.ප.ච 04/2017 ට අනුව එම ශිෂ්‍යාවට ගෙවීම් රහිතව ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අනුමැතිය ලබා දීම සුදුසු බව ,ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

06

**ඊ-16**

රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2026.02.26 වන දින අනුමත කර එවන ලද රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම (MRF)ව්‍යාපෘතියට අදාල යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම අනුමත මුදල රු.19,160,224.35 වේ.මෙම ව්‍යාපෘතියේ වැඩ 2026.11.15 දිනට පෙර අවසන් කර බිල්පත් ඉදිරිපත් කළ යුතුය.ඒ අනුව ලබා දී ඇති උපදෙස් පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා විසින් අදහස් දක්වන ලද අතර මේ සම්බන්ධව ඉඹුලාන ප්‍රදේශයේ ජනතාවගේ විරෝධයක් ඇති බවත්,තමාද මෙයට පෞද්ගලිකව විරෝධය ප්‍රකාශ කරන බව දක්වන ලදි.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.එහිදී මෙම අවස්ථාව දිස්ත්‍රික්කයෙන්ම අපට පමණක් ලැබී තිබෙන බවත්,ලක්ෂ 191 ක විශාල ව්‍යාපෘතියක් බවත්,මෙහිදී කසල ගෙනවිත් දැමීමක් සිදු නොවන බවත්,ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම ලෙස වන බවත්, මේ පිළිබඳව විස්තරයක් ලෙස ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් යනු වර්ගීකරණය සැකසීම සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා පහසුකම් සපයන ස්ථානයක් බවත්,මෙම මධ්‍යස්ථාන වලදී ප්ලාස්ටික්, වීදුරු,ලැහැසි සහ කඩදාසි වැනි ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වර්ගීකරණය කරන බවත්,සැකසීම හා ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීම මෙයින් සිදු කරන බවත්,මෙහිදී වාසි ගණනාවක් ඇති බවද ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය ප්‍රමාණය වැඩි කර ගත හැකි බවද දක්වන ලදි.පරිසර දූෂණය අවම කර ගැනීමටද හැකි වන බව දක්වන ලදි.ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන බවද ප්‍රජාවගේ සහභාගීත්වය වැඩි කර ගැනීමටද හැකිවන බව දක්වන ලදි.මෙය සියලු දෙනා එකතු වී කරණ වැඩසටහනක් බව දක්වන ලදි.මෙය පළාත් පාලන සභිකයකු ලෙස විරුද්ද විය නොහැකි අවස්ථාවක් ලෙස දකින බවද පෙන්වා දෙන ලදි.

නැවත වතාවක් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා විසින් මෙහිදී මෙම විරෝධය මෙම ස්ථානය පිළිබඳව ඇති වී තිබෙන බවද දක්වන ලදි.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම ස්ථානය අප විසින් තෝරාගෙන ඇති ස්ථානයක් නොවන බවත්,පර්යේෂණ කණ්ඩායමක් පැමිණ මෙම ස්ථානය තෝරාගෙන ඇති බව දක්වන ලදි.

එම යෝජනාව සම්බන්ධයෙන් වෙනත් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රාජ්‍ය පරිපාලන ,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් 2026.02.26 වන දින අනුමත කර එවන ලද රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ඉදි කිරීම (MRF)ව්‍යාපෘතියට අදාල යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත්, අනුමත මුදල රු.19,160,224.35 වේ.මෙම ව්‍යාපෘතියේ වැඩ 2026.11.15 දිනට පෙර අවසන් කර බිල්පත් ඉදිරිපත් කළ යුතුය.ඒ අනුව ලබා දී ඇති උපදෙස් පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවත් , ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

07

**ඊ-17**

අඟුරුවැල්ල පොදු වෙළඳපල උඩු මහල අංක 09 කඩ කාමරයෙහි බදුකරු G.A.මෛත්‍රීපාල මියගොස් ඇති බැවින් එම කඩ කාමරයේ අයිතිය ඔහුගේ එකම පුතා වන G.A.A.S.ගොඩමුනේ වෙත බදු අයිතිය පැවරීමට හා නිට්ටඹුව බස් නැවතුම්පොල අංක 29 කඩ කාමරයේ බදුකරු U.D.විජේසිංහ මියගොස් ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුගේ බිරිඳ වන K.P.ජේම ජයන්ති යන අයට පැවරීමට 1/2023 චක්‍රලේඛයේ අංක 8,9 වගන්තියේ (ඇ)කොටසට අනුව සිදු කිරීමට ගරු මහ සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, අඟුරුවැල්ල පොදු වෙළඳපල උඩු මහල අංක 09 කඩ කාමරයෙහි බදුකරු G.A.මෛත්‍රීපාල මියගොස් ඇති බැවින් එම කඩ කාමරයේ අයිතිය ඔහුගේ එකම පුතා වන G.A.A.S.ගොඩමුනේ වෙත බදු අයිතිය පැවරීමට හා නිට්ටඹුව බස් නැවතුම්පොල අංක 29 කඩ කාමරයේ බදුකරු U.D.විජේසිංහ මියගොස් ඇති බැවින් එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුගේ බිරිඳ වන K.P.ජේම ජයන්ති යන අයට පැවරීමට 1/2023 චක්‍රලේඛයේ අංක 8,9 වගන්තියේ (ඇ)කොටසට අනුව සිදු කිරීම සුදුසු බව ,ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

08

**ඊ- 18**

පළාත් පාලන මාර්ග සංවර්ධනය 2025 සංවර්ධන වැඩසටහන යටතේ අප සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද ලෙනගල කම්හල්හේන මාර්ගය සංවර්ධනය කිරීම රු.855,000.00ක චෙක්පත අදාල කොන්ත්‍රාත් සමිතියට ගෙවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එම්.බී. ස්වර්ණතිලකා මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පළාත් පාලන මාර්ග සංවර්ධනය 2025 සංවර්ධන වැඩසටහන යටතේ අප සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද ලෙනගල කම්හල්හේන මාර්ගය සංවර්ධනය කිරීම රු.855,000.00ක චෙක්පත අදාල කොන්ත්‍රාත් සමිතියට ගෙවීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ,ඒකමතිකව සහා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

09

සංශෝධන යෝජනා ලෙස,

**ඊ-19**

2026.02.12 දින ගරු මහ සභාවේ ඊ 16 දරණ සහා තීරණය සංශෝධනය කර ගැනීම සඳහා ඉදිරිපත් කරන යෝජනාවයි.

එම සභා තීරණය අනුව කමිටුවක් පත්කර ක්ෂේත්‍රයේ තත්වයන් පරීක්ෂා කළ අතර,එහිදී මූලික අවශ්‍යතාවය වන්නේ ප්‍රධාන මාර්ගයට බාධාකාරී අයුරින් මාර්ග රක්ෂිතය තුළ ඉදිකර ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කළයුතු බව නිරීක්ෂණය විය.
මීට පෙර අවිස්සාවේල්ල-කෑගල්ල මාර්ගය පුලුල් කරන අවස්ථාවේ ප්‍රධාන මාර්ගය දෙපස ගොඩනැගිලි යම් සීමාවක් දක්වා ඉවත් කරගෙන ඇති අතර ඒ සඳහා වන්දි ගෙවීමක්ද සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.
එබැවින් මෙම සභා තීරණය සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාව.එනම් ප්‍රධාන මාර්ගයට බාධාකාරී අයුරින් හා මාර්ග රක්ෂිතයේ සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ තැබීම් ඉවත් කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. මධුෂ සචිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2026.02.12 දින ගරු මහ සභාවේ ඊ 16 දරණ සභා තීරණය සංශෝධනය කර ගැනීම සඳහා ඉදිරිපත් කරන යෝජනාවයි.
එම සභා තීරණය අනුව කමිටුවක් පත්කර ක්ෂේත්‍රයේ තත්වයන් පරීක්ෂා කළ අතර,එහිදී මූලික අවශ්‍යතාවය වන්නේ ප්‍රධාන මාර්ගයට බාධාකාරී අයුරින් මාර්ග රක්ෂිතය තුළ ඉදිකර ඇති සියලු අනවසර ඉදිකිරීම් ඉවත් කළයුතු බව නිරීක්ෂණය විය.
මීට පෙර අවිස්සාවේල්ල-කෑගල්ල මාර්ගය පුලුල් කරන අවස්ථාවේ ප්‍රධාන මාර්ගය දෙපස ගොඩනැගිලි යම් සීමාවක් දක්වා ඉවත් කරගෙන ඇති අතර ඒ සඳහා වන්දි ගෙවීමක්ද සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.
එබැවින් මෙම සභා තීරණය සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේ යෝජනාව.එනම් ප්‍රධාන මාර්ගයට බාධාකාරී අයුරින් හා මාර්ග රක්ෂිතයේ සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ තැබීම් ඉවත් කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව, ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

10

**ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතාගේ යෝජනාව,**

**ඊ-20**

මහජන ඉල්ලීම් මත රුවන්වැල්ල නිට්ටඹුව මාර්ගයේ පාලම අසල විදුලිබල මණ්ඩලයේ විදුලි රැහැන නොමැති නිසා සෝලා විදි ලාම්පුවක් සවි කිරීමට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව,එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, මහජන ඉල්ලීම් මත රුවන්වැල්ල නිට්ටඹුව මාර්ගයේ පාලම අසල විදුලිබල මණ්ඩලයේ විදුලි රැහැන නොමැති නිසා සෝලා විදි ලාම්පුවක් සවි කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

11

ඊ-21

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් ලංකා බැංකුව අසල කිරිහල සම්බන්ධව 2026.01.12 දිනැතිව නිකුත් කර ඇති රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සිදුවන අක්‍රමිකතා විශේෂ අභ්‍යන්තර විගණන වාර්තාව -2025 ට අනුව නිර්දේශ ක්‍රියාත්මක කිරීමට එහි බදුකරු වන K.A.N.කොඩිතුවක්කු වෙත ලිඛිතව දැනුම් දෙන ලදි.ඉන් අනතුරුව බදුකරු විසින් කරුණු 03ක් යටතේ සාධාරණ සහන කාලයක් ඉල්ලා ඇත.ඒ අනුව මෙම කිරිහල සම්බන්ධව තීරණ ගැනීමට ගරු මහ සභාවට ඉදිරිපත් කිරීමේ යෝජනාව.

මෙම යෝජනාව ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව හා සම්බන්ධ ලිපියක් පවතින බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදි.කොඩිතුවක්කු යන මහත්මිය විසින් ලිපියක් එවා ඇති බව ද එය මෙලෙස ඉදිරිපත් කරන ලදි.“.ගරු සභාපතිතුමා ,ලේකම්තුමා ,ප්‍රාදේශීය සභාව රුවන්වැල්ල.රුවන්වැල්ල පොදු වෙළඳපොළ ඉදිරිපිට ලංකා බැංකුවට යාබදව පිහිටි කිරිහල සඳහා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සමග ඇති කරගත් ගිවිසුමෙන් නීත්‍යානුකූලව ඉවත් වීම සම්බන්ධවයි.
ඉහත ලිපිනයේ පදිංචි කේ .ඒ.එන්. කොඩිතුවක්කු වන මා 2014 වර්ෂයේදී පමණ එවකට රජයේ දියර කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ගැන දැනුවත් වීම මත එම නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ඇරඹීමේ අදහසින් එවකට ඒ සඳහා ලබා ගතයුතු නිර්දේශ හා අනුමැතීන් ලබා ගනිමින් ඒ සඳහා ස්ථානයක්ද නීත්‍යානුකූලව ලබා ගත හැකි ආකාරය ගැන එවකට ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීමක් කළෙමි.එම ඉල්ලීමට අදාළව ප්‍රාදේශීය සභාවේ අදාළ නීති රීතීන්ට අදාළව එම භූමියේ වර්ග අඩි ප්‍රමාණයට ප්‍රාදේශීය සභාවෙන් ලබාදුන් තක්සේරු මුදල් ගෙවමින් 2015.06.19 දින එම භූමියේ  මා විසින් ඉදිකිරීම් කටයුතු සිදුකර ගනිමින් කිරි හලක් පවත්වාගෙන යාම සඳහා රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට එළඹුනෙමි.පසුව එම ස්ථානයේ කිරිහල ඉදිකර රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත මාසික බදු කුලිය ගෙවමින් මේ වන තෙක් පවත්වාගෙන ආවෙමි.රජයේ මිල්කෝ ආයතනයේ දියර කිරි හා කිරි නිෂ්පාදනත් වෙනත් පුද්ගලික ආයතන වල කිරි නිෂ්පාදනත් ප්‍රදේශයේ කිරි ගොවීන්ගේ නැවුම් එළකිරි මෙහි අලෙවි කළෙමි.මෙම ව්‍යාපාරයෙන් මා විශාල ආදායමක් නොලැබුවද මෙමගින් මෙහි සේවය කරන සේවක මහතාගේ පවුලේ ජීවන මාර්ගය  වීමත් ප්‍රදේශයේ ජනතාවට සාධාරණ මිලකට උසස් තත්ත්වයේ කිරි නිෂ්පාදන ලබා දෙමින් නොයෙක් සමාජ සත්කාරයන් සඳහා විශේෂයෙන් රුධිරදාන වැඩසටහන් ආදියට මෙම කාලය තුළ දියර කිරි හා යෝගට් වැනි කිරි නිෂ්පාදන ලබා දෙමින් දායක වීමට ලැබීම ද සතුටින් ප්‍රකාශ කරමි.ගරු සභාපතිතුමනි,ලේකම්තුමනි, මා වෙත මේ වනවිට දැනගැනීමට ලැබී ඇති පරිදි මෙම කිරිහල සම්බන්ධව යොමු කර ඇති පෙත්සමකට අදාළව මෙම විමර්ශනය මගින් මාගේ ස්වාමියා රුවන්වැල්ල සභාවේ සේවකයෙකු වන නිසා සභාව සමඟ මා ඇති කරගෙන ඇති ගිවිසුම නීත්‍යානුකූල නොවන බව දැනගන්නට ලැබී ඇත.මෙම ගිවිසුමට එළඹි දින සිට මේ දක්වා වසර දහයකට ආසන්න කාලයක් මෙය නීත්‍යානුකූල නොවන ගිවිසුමක් බව මා නොදැන සිටි අතර ඒ සම්බන්ධව වගකිවයුතු පාර්ශව විසින් මා දැනුවත් කර නොමැති බවද වගකීමෙන් යුතුව ප්‍රකාශ කරමි.කරුණු මෙසේ හෙයින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සමඟ මා ඇතිකරගන්නා ලද ගිවිසුමෙන් ඉතා සදාචාර සම්පන්න ලෙසත් යුක්තිගරුක ලෙසත් සියලු නීතිරීතින්ට ගරු කරමින් ද පහත සඳහන් කරුණු කෙරෙහි ද ඔබතුමාගේ සැලකිල්ල යොමුකරමින් ඉවත් වීමට කටයුතු සලසා දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

- මා විසින් ලබාගෙන ඇති ජලය හා විදුලිය විසන්ධි කිරීම.
- මා විසින් මෙම භූමියේ ඉදිකර ඇති මා හට අයත් දේපල ඉවත් කර ගැනීම.
- වෙළඳ ගණුදෙනු කරුවන් හා ණයගැති සම්බන්ධතා තුලනය කරගැනීම සඳහා යම් සාධාරණ සහන කාලයක් ලබා ගැනීම.

මෙයට විශ්වාසී,කේ.ඒ.එන් කොඩිතුවක්කු.  ”ලෙසින් දක්වන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු  සභාපතිතුමා විසින් විමසන ලදුව,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය මේ පිළිබඳව “  ඇත්තටම මේ අදාල පුද්ගලයා නෙවෙයි අලෙවි කරන්නේ.අසාධාරණයක් වෙනවා නේද.අසාධාරණයක් නොවෙන්න වැඩ කලොත් හොඳයි නේද.” ලෙස දක්වන ලදි

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

ඒකට තමයි මේක දැම්මේ.මේ සම්බන්ධයෙන් විමසීම් කළා.ඇත්තටම මේක අපිටත් අත්දැකීමක් නැති ප්‍රශ්නයක්.මොකක්ද ගන්න තීරණය කියල.ඒ කියන්නේ මේකේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. ගොඩනැගිල්ල හදලා තියෙන්නේ අපි නෙවෙයි.ඒක හදල තියෙන්නෙ එයාලා.අදාළ පාර්ශවය.එතකොට පවරා ගන්නේ අපි මොකක්ද ඒගොල්ලෝ ගලවගෙන අයින් කර ගත්තොත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

ගරු සභාපතිතුමනි,ඇත්තටම භූමියේ සන්තකය තියෙන්නේ ප්‍රාදේශීය සභාවටනේ.එතකොට ගිවිසුම තුළදී ගිවිසුමේ මොනවා හරි අන්තර්ගත වෙලා තියෙනවද? මේකෙන් ඉවත්වෙන්න උනොත් මෙන්න මේ කාරණාව කියලා ගිවිසුම අත්සන් කරලා.සභාව සහ ඒ තැනැත්තා අතර.ඒ ගිවිසුම බලලා .සන්තකය තියෙන්නේ එතන.

ප්‍රාදේශීය සභාවට සන්තකය තියෙන්නෙ.එහෙම නම් හැමෝම මේක ගලවාගෙන යන්න ඉල්ලුවොත් ගිවිසුමක් එනවා නම් ගිවිසුමේ අවසන් කොන්දේසියක් එන්න ඕනේ.කොන්දේසියක් නැතුව කොහොමද ඒක අත්සන් කරලා තියෙන්නේ.එහෙම නැත්තම් ඒක ප්‍රාදේශීය සභාව සතු දේපලක් බවට පරිවර්ථනය වෙනවා නීත්‍යානුකුලව. එහෙමනම් ගරු සභාපතිතුමනි ,හැම එක්කෙනාම ඉදිකිරීම් සියල්ලම මම ගලවගෙන යනවා වගේ කියන්න පුලුවන්. ඔබතුමාලා නීති උපදෙසක් ගන්න.නමුත් නෛතික භාවය තියෙන්නෙ සභාවට.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා,

මේ ගිවිසුමේ කොන්දේසි ගණනාවක් තියෙනවා.ඒකත් ප්‍රශ්නයක්.රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේදී ඇති කර ගත් ගිවිසුම කියලා එකක් තියෙනවා.එයාට හදන්න කියලා තමයි මේකේ තියෙන්නේ.මේකේ තියෙනවා බදුකරු විසින් එකී ඉඩම් හිමියාගෙන් රුවන්වැල්ල නගරයේ පොදු වෙළඳපල ඉදිරිපිට ලංකා බැංකු ගොඩනැගිල්ලට යාබදව කිරිහල සඳහා අඩි 10*12 දිග හා පළල ඇති භූමියේ බදු අයිතිය මාසිකව රු.1350.00ක මාසික ගාස්තුවකට බදුදෙනු ලැබේ. ඒක තමයි තියෙන්නේ.

එම බදු මුදල් තක්සේරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික තක්සේරුව මත එම භූමියට අදාල බදු මුදල් ඉදිරි අවස්ථාවකදී බදු දීමනාකරු විසින් වෙනස්වීම් වලට භාජනය කරනු ලැබේ.

මෙම කිරිහල සඳහා සියලු ඉදිකිරීම් ප්‍රාදේශීය සභාවේ උපදෙස් පරිදි බදුකරුගේ වියදමින් ඉදිකර ගත යුතුය.

බදුකරු විසින් ඉඳුදීම්කාර පක්ෂය මුලිකව ලබාදුන් 10*-12 ප්‍රමාණය ඉක්මවා කිසිඳු ඉදි කිරීමක් නොකල යුතුය.

බදුදුන් භූමිය තුළ යම්කිසි භෞතිකමය වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම් බදු දීමනාකාර පක්ෂයේ අනුමැතිය ලබාගෙන සිදුකළ යුතුය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

බදු දීමනාකාර පක්ෂයේ අනුමැතිය ලබාගෙන සිදුකළ යුතුය.බදු දීමනාකාර පක්ෂය සභාව.එයාලට හිතු මනාපයට තීරණය කරන්න බැ.සභාව තමයි තීරණය කරන්න ඕනේ මේ ගොඩනැගිලි ඉවත් කරන්න එයාට අවසරය දෙනවද කියලා .වෙනස් කිරීමක් කියනකොට ඉවත් කිරීමක් අදහස් වෙනවා.ඔබතුමා අවසන් කොන්දේසිය කිව්වේ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා,

අවසන් කොන්දේසිය කිව්වේ ,
බදු දුන් භූමිය තුළ යම්කිසි භෞතිකමය වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නම් බදු දීමනාකාර පක්ෂයේ අනුමැතිය ලබාගෙන සිදුකළ යුතුය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

බදු දුන් භූමිය තුළ යම්කිසි භෞතිකමය වෙනසක් ,ඉවත් කර ගැනීම කියන්නේ භෞතිකමය වෙනසක්.එතකොට වෙනසක් වෙනවා නම් සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.මේගොල්ලන්ට යන්න.එහෙම නැතුව මෙයාගේ ඉල්ලීම පරිදි මෙහෙම කරන්න බැ.ඒක සභාව තීරණය කරන්න ඕනේ අපි එයාට දෙනවද නැද්ද කියලා.අනික විදුලි බිල හා ඒ ටික අරන් තියෙන්නේ කාගෙ නමින්ද දන්නේ නැ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා,

එයාගේ නමින්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

එහෙම නම් එයාට විසන්දි කරන්න ගැටලුවක් එන්නේ නැ.අර කොන්දේසිය තියෙන නිසා සභාවට ඕකේ පුර්ණ බලයක් ඇවිල්ලා තියෙනවා මම හිතන හැටියට.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා,

ගරු සභාපතිතුමනි ,ඒ ගිවිසුමේම තියෙනවා ඉදි කරාට පස්සේ අයිතිය හිමි වෙන්නේ සභාවම තමයි.එතුමා මතු කරපු කොන්දේසිය අනුව අපිට තමයි එකේ අයිතිය හිමි වෙන්නේ.භෞතික වෙනස් කිරීමක් තමයි ඉවත් කිරීමත්.ඒක සභාවට අවශ්‍ය නම් නැවත බදු කරුවෙකුට දෙනවා නම් නගරය අලංකරණය කර ගන්න අවශ්‍ය නම් ඒක සභාව තීරණය කරන්නේ ඉවත් කිරීම කරන්න.අනික මේකේ පැහැදිලිව පේන එකක් තමයි මේවා මේ වෙලා තියෙන්නේ නීතිය නොදැන සිටීම කියලා ලිපියේ තිබුනානෙ මම දැනුවත් වෙලා නෑ කියලා.නීතියේ තියෙනවානේ කාරනාවක් නීතිය නොදැන සිටීම නිදහසට කාරනාවක් නෙවේ කියලා.ඒ අනුව මේවා මතුපිටින් පේන දේ තමයි මේක දේශපාලන හිතවත්කම් වලට ගිය දෙයක් බොහොම සාධාරණව විනිවිද භාවයකින් ගිහිල්ලත් නෑ.දියර කිරි ප්‍රචලිත කිරීම හා ඒ දේවල් හොඳ දේවල් තමයි.හැබැයි එතන වෙන එකක් පේන්න තියෙනවා.ඒක නිසා සභාවේ සභිකයින් ගන්න තීන්දු ඉදිරියේදී බලපානවා සභිකයන්ට.ඒ නිසා නීතිමය ප්‍රතිපාදන ඇතුව මේක අපිට තීරණය කරන්න බැරිනම් නියමිත ක්‍රමවේදයකින් අනුමැතියකින් යටත්ව කරන එක තමයි සුදුසු කියන එකයි මගේ අදහස.

ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා,

ගරු සභාපතිතුමනි.මේක ටිකක් සංවාදාත්මක කරුණක්.ඒ එක්කම නීති හා සම්බන්ධ ගැටෙන ප්‍රශ්නයක්.ඊගාවට අපි මීට ඉහත සභාවාරයේදී තමා අපි මේ සම්බන්ධයෙන් පැවරීම සම්බන්ධ ක්‍රියාවලියේදී කොමසාරිස් තුමාගෙන් අදහස් විමසුවා ඒ පිළිබඳ අදහසක් ආවෙත් නෑ.මම හිතන්නෙ තාම ඒ නිසා අපිට දැන් මේ මොහොතේදී මේකට මෙහෙම කරමුයි කියන තීන්දුවකට යනවට වඩා මේකේ නීතිමය තත්ත්වයත් විමසල ඒ වගේම මීට වඩා සංවාදයකට ලක් කරලා තීන්දුවක් ගමු යැයි කියන යෝජනාව කරනවා.මේ යෝජනාව අපිට කල් තබා ගැනීම සඳහා මේක සාකච්ඡාව සඳහා කාලයක් අවශ්‍ය වෙනවනේ ඊගාවට.නැත්තං එහෙම නම් නීති උපදෙස් සඳහා යොමු කරනවා.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

මේ සියලු කාරණා එක්ක.එක්කො පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගෙන් උපදෙස් ගන්න වෙනවා.

ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා,

නීතිමය උපදෙස් සඳහා යොමු කරන්න පුළුවන්නේ වැඩිදුර උපදෙස් සඳහා යොමු කරන්න.කියන එක තීරණය තමයි යන්න වෙන්නේ. එක්කෝ අවසර දෙන්න ඕන නැත්නම් බෑ කියන්න ඕනෙ.ඔය තීන්දු දෙක මත හිර වෙන්නේ .ඔය දෙකම නැතුව අපි අතනට ගියාට පස්සෙ එන උපදෙස් මත තීන්දුවක් ගමු.ඒ සඳහා යොමු කරමු කියන එක තමයි අදහස් කරන්නේ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

මේ එවලා තියෙන්නේ විගණන නිර්දේශයක් .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

ඒ නියෝගය දීලා තියෙන්නේ පළාත් පාලන කොමසාරිස්තුමා ද?ක්‍රියාත්මක කරන්න.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

පණත අනුව ක්‍රියාත්මක කරන්න කියලා තමයි ඔඩිට් එකෙන් කියන්නේ. කොමසාරිස්තුමා දෙන්නෙ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

දැන් නැවත ගියත් ඔකම තමයි.දෙන්නේ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

පණත අනුව මොකක්ද කියන එකයි පැහැදිලි කරගන්න අමාරු.ගිවිසුමෙත් එහෙම එකක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා,

අනිත් එක සභාපතිතුමනි.අයිතිය සහ ස්වාමීත්වය කියන්නේ දෙකක්. මට ඉඩමක අයිතිය තිබුණට මම ගෙයක් හදලා ,දීලා තිබුණා නම් එතැන ස්වාමිත්වය විතරයි තියෙන්නෙ .මම එතනින් යනකොට මට ඒ ගේ අයිති කරගෙන යන්න බැහැ.මම ඒකෙ මොනවා හරි අතුරු දෙයක් හැදුවත් අයිතිය තියෙන්නෙ මට.ස්වාමීත්වය ඉන්නකම් තියෙනව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා,

ගරු සභාපතිතුමනි.මේක කල් දීල සාකච්ඡාවට ගන්නවා නම් තමයි වැදගත්.ඒ නිසා අපේ උප සභාපතිතුමා ගෙනාපු අදහස බොහොම කාලෝචිතයි.ඒක නිසා මම නම් කියන්නේ මේක න්‍යාය පත්‍රයට ඇතුල් කරල හදිසි යෝජනාවක් විදිහට ගන්නවට වඩා මේකෙ හොඳම ක්‍රමවේදය තමයි න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා න්‍යාය පත්‍රය හරහා කල් දීලා මේක සාකච්ඡාවකට ගන එක. උප සභාපතිතුමාගේ තීන්දුවට නම් මම එකඟ වෙනවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. සෙනරත් බංඩාර රාජපක්ෂ මහතා,

ගරු සභාපතිතුමනි.මේ සම්බන්ධයෙන් මමත් පොඩි අදහසක් ඉදිරිපත් කරන්නම්.අවසරයි දැන් මේකෙදි අපි බලන්න ඕනේ මේ ගිවිසුම කොහොමද ඇතිවුනේ කියන එක.එතකොට ගිවිසුම ඇති කරන කොට මෙයා සභාවේ සේවකයෙක් ද ඒ ප්‍රශ්නෙ තියෙනවා.එතකොට අපි ගිවිසුම්ගත වෙලා ඉන්නේ ඒ පුද්ගලයා එක්ක නෙමෙයි.එයාගේ තව කවුරුහරි සමීපතමයෙක් එක්කනෙ.එතකොට එතැනදී මේක සභාව විසින් යම් තීරණයක් ගත්තොත් අපිට ඊට පස්සේ අධිකරණ ක්‍රියාමාර්ගයකදී අධිභාරයක් එන විදිහේ වැඩක්.එයා ඊටපස්සෙ නීති ක්‍රියාමාර්ගයක් ගත්තොත් මොකද වෙන්නේ අපිට.මට හිතෙනවා සභාව පරදින්න බෑනේ.එතකොට සභාව ගත්ත තීරණයකදී එහෙම දෙයක් වෙලා තියෙනවා.මීට ඉස්සර වෙලා අනුරාධපුර පැත්තේ ප්‍රාදේශීය සභාවක් ඒක කොන්ත්‍රාත්කරුවෙකුට ගෙවපු නැති නිසා සභාවේ තිබ්බ යන්ත්‍රසූත්‍ර වෙන්දේසි කරලා දුන්නා.ඒ වගේ ප්‍රශ්නයක් නොවෙන විදිහට මම හිතනවා මේක අපි එක්කෝ පළාත් පාලන කොමසාරි කාර්යාලයේ ඉන්න නීතිඥවරයා හරහා ඊට එහා ගිය මේක හොඳින් අධ්‍යනය කරපු නීතිවේදියකු හරහා අපි මේකට උපදෙස් අරගෙන තමයි මම හිතනවා මේ සභාව ක්‍රියාත්මක වෙන්න ඕනෙ.මොකද දැන් බැරිවෙලාවත් මේක අපි කරාට පස්සේ එයා නඩුවක් දැම්මොත් අපිට තියෙන අවාසි මොනවාද කියලත් බලන්න ඕන.එයා ඊට ඉස්සර වෙලා මේකෙ සේවකයෙක් නෙවෙයි නං එහෙම නම් දෙවනුව එයා ඊටපස්සෙ සේවකයෙක් වුණාට පස්සේ එතකොට එයාගෙ නෝනා බැඳිලා නෑ. ඉතින් ඒ නිසා පෙර දේවල් හොයලා වර්තමාන තත්වය බලලා තමයි මේකෙදී තීරණයක් ගන්න ඕනේ කියලා මම යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා,

ගරු සභාපතිතුමනි. මේකෙ වර්තමාන තක්සේරුව අනුව දෙයක් කරන්න බැරිද

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. සරත් සිරිවර්ධන මහතා,

ගරු සභාපතිතුමනි.මේකේ අයිතිකාර මහත්මයා හෝ මහත්මිය ඉදිරිපත් කරලා කොන්දේසි තුනක් තියෙනවනේ. එයාගේ ඉල්ලීමක් නේ. ඒ ඉල්ලීම කවුන්ටර් කරලා අපි ලෝයර් කෙනෙක්ගෙන් අහලා කථා කරලා ඒ විදිහට කටයුතු කරන්න අමාරුද?පෞද්ගලිකව ඉල්ලලා තියෙනවා.එයා කාරණා තුනක්.ඒ කාරණා තුනටම අපි ලෝයර් කෙනෙක්ගෙන් අහලා මෙතුමියගේ ඉල්ලීම කොච්චර ලීගලි ද කියන එක. ඒ අනුව කටයුතු කළා නම් හරි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.ඒ. චන්ද්‍ර පුෂ්ප කාන්ති මහත්මිය,

සභාවේ නීති තියෙනවානෙ.ඒ නීති පැහැදිලි කරලා දීලා කරන්න බැරිද? එහෙම කැමතිද කියලා අහලා.අලුත් කෙනෙකුට දෙන්න ටෙන්ඩර් දාලා ඒ ගොල්ලන්ට ලබාදෙන්න නැත්නම් වෙනත් කෙනෙක්.වෙනත් ස්ථානයක් දෙන්න බැරිද?.වෙනත් ආයතනයකට දීලා ඉවරවෙලා කඩල අයින් කර ගන්න කැමතිද කියලා මොකක් හරි ඒ ගොල්ලන් එක්ක නීති උපදෙසුත් එක්ක කලා නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා

අපිට තීරණය කරන්න බැරි නම් බාහිරින් උපදෙස් අරන් තමා කරන්න වෙන්නෙ.නීතිඥයකුගෙන් හෝ නීති සමාගමක උපදෙස් අරගෙන තමයි මේක කරන්න වෙන්නේ.අපි දැනුවත් විදිහට අපි අහලා තියෙන විදිහට සභාව ලොකු පාඩුවක් දරන්න ඕනේ.එදා අර මතු කරපු විදිහට ඒ ගිවිසුම වැරදි සහගතයි. අනික තමයි දැනටත් ඔහුගේ වටිනාකම සාමාන්‍යයෙන් වෙළඳපොල වටිනාකම රුපියල් තිස් දාහක් විතරනේ.සභාවට රුපියල් එක් දහස් තුන්සියයක් විතර වගේ ගාණක් තමයි එන්නේ මම දැනුවත් විදිහට එතකොට සභාවට එන්න තියෙන එකක්. මම යෝජනා කරන්නේ කිසිදු වෙනස් කිරීමක් කරන්න එපා කියන එක.කඩා ඉවත් කරන්න එයාට බලය දෙන්න ඕනේ නැහැ.එපා කියන එක කියනවා .ඒ අතර කාලය ඇතුළත අපි නීති උපදෙස් අරගෙන නැවත මේක පවරගෙන දෙනවා. ටෙන්ඩර් ක්‍රමයට. ඒ අනුව සභාවට ලොකු ආදායමක් ගන්න පුළුවන්. කියන එකයි මගේ අදහස.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

අපිට ඕන්නම් විශේෂ සභාවක් ඇඳ වන්නත් පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා,

ගරු සභාපතිතුමනි ,අපිට බැරිද ඔය ගිවිසුම්කරු එක්ක කතා කරලා.ඕක එයාට ඉදි කරන්න ගිය මුදල දීලා හරි සභාවට ඒක ගන්න පුළුවන් ක්‍රමයක් තියෙනවද?

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

ඒක කරන්නත් පුළුවන්ද කියන ප්‍රශ්නේ තමයි ඔය තියෙන්නෙ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා,

එහෙමනම් ඉතිං නීතිමය උපදෙස් ගන්න තමයි යොමු කරන්න තියෙන්නේ.

ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යාරත්න මහතා,

අපි සතු තොරතුරු තියෙනවනෙ.ගිවිසුම තියෙනව ඉල්ලීම් ලිපිය තියෙනවා. විගණන නිර්දේශයන් ටික තියෙනවා. මේ සියල්ල එකතු කරලා අපි එක පැත්තකින් ලියුමක් සකස් කරමු.කොමසාරිස්තුමාගෙන් මෙන්න මේවා තියෙන්නේ කියලා.මේකට අදාල උපදෙස් ගන්නත් ඒ වගේම ඊළඟ සභාවාරයට දාලා නීතිමය කාරණා සාකච්ඡා කරගෙන මේක සාකච්ඡා කරන්න ලබන සභා වාරයේ න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්න තීරණය කරනවා.මේ ගැටලු සම්බන්ධයෙන් ඊට අමතරව පළාත් පාලන කොමසාරිස්තුමාට අපි සතු තොරතුරු සහිතව නැවත උපදෙස් පතන ලියුමක් නිකුත් කරනවා.සහකාර කොමසාරිස්තුමා වෙත.ලෙස ප්‍රකාශ කරමින් එම යෝජනාව සම්බන්ධයෙන් කිසිඳු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ඒකමතිකව සභා සම්මත වු බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

උ. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

1. 2026.02.26 දින කාර්මික සේවා කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 02)
2. 2026.02.26 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 04)
3. 2026.02.30 දින පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 05)
4. 2026.02.20 දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව(ඇමුණුම් අංක 06)

මෙම වාර්තා ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා වෙත ලබා දී ඇති බවත්,මෙම වාර්තා සභාගත කෙරෙන බව ගරු සභාපතිතුමා විසින් දක්වන ලදි.

**ඌ. 2026 පෙබරවාරි මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ගෙවීම් සාරාංශය, ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව,(මෙම වාර්තා මහා සභාව පැවැත්වෙන දින ලබා දීමට කටයුතු කෙරුණි) මාසික ගෙවීම් වාර්තාව හා වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

ඌ 01
2026 පෙබරවාරි මස ගෙවීම් වාර්තාව(ඇමුණුම 07)
ඌ 02

2026 ජනවාරි මස අභ්‍යන්තර විගණන වාර්තාව(ඇමුණුම03 )
ඌ 03
2026 පෙබරවාරි මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය
ඌ 04
2026 පෙබරවාරි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය
ඌ 05
2026 පෙබරවාරි මස ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය
ඌ 06
2026 පෙබරවාරි මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය
ඌ 07
2026 පෙබරවාරි මස ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
ඌ 08
2026 පෙබරවාරි 28 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
යනාදී මෙම වාර්තා සභා ගතකරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**2026.01.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

**2026.02.31 දිනට මූල්‍ය තත්වය**

| බැංකුවේ නම | ගිණුම් අංකය | මුදල |
|---|---|---|
| මහජන බැංකුව රුවන්වැල්ල | (පොදු ගිණුම) 081-1-001-3-4928744 | 20,188,782.31 |
| මහජන බැංකුව රුවන්වැල්ල | (සේවක ණය ගිණුම) 081-1-001-7-4928780 | 1,331,192.88 |
| **ස්ථාවර තැන්පත්** | | |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | | 1,000,000.00 |

| | |
|---|---|
| මහජන බැංකුව රුවන්වැල්ල | 40,000,000.00 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව - රුවන්වැල්ල | 10,000,000.00 |
| **එකතුව** | **72,519,975.19** |

**එ. සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සියලුදෙනාගෙන්ම අවසරයි.ගරු සභාපතිතුමනි මොරාවත්තේ රත්තාගල මාර්ගයේ මොරාවත්තෙන් රත්තාගල මාර්ගයට හැරෙන තුන්මං හන්දියේ පාලම ඉහළගම පාරෙන් එන වාහන ප්‍රධාන මාර්ගයට වැටෙනකොට එතන තියෙනව අවධානම් තත්ත්වයක්.එතන පාරේ එහා පැත්තේ මාර්ගයෙන් එන වාහන ප්‍රධාන මාර්ගයේ යන වාහන වලට පේන්නේ නෑ.එහෙම දෙයක් තියෙනවා මේ මාර්ගය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිතියි.දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලයේ මාර්ගයක් තමා මොරාවත්ත රත්තාග මාර්ගය.ආර් ඩී. එකේ මාර්ගයක් තමා.වේයන්ගොඩ රුවන්වැල්ල මාර්ගය.අපිට බැරිද? ආර් ඩි එකත් දැනුවත් කරලා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියත්,දෙහිඕවිට විධායක ඉංජිනේරු කාර්යාලය දැනුවත් කරලා.එතනට මොනවා හරි අර පාරෙන් එන වාහනයි මේ පාරෙන් එන වාහනයි පේන්න මොනවා හරි කණ්ණාඩියක් වගේ එතන හරි අවදානම්. ගෙවල් තියෙන්නෙ පාර අයිනටම වෙන්න නේ එතකොට පාර පළල් කිරීමක් කරන්න එතන අපහසුයි.එතන වෙන ඇක්සිඩන්ට් වළක්වා ගන්නත් ඕනේ.ඒ හින්දා මොකක් හරි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියයි ආර් ඩී එකයි කතා කරලා දෙයක් කළොත් නරකද මොනවා හරි දෙයක් අපිට අදාල නෑ.ප්‍රාදේශීය සභාවේ අයිති පාරක් නෙවෙයි.නමුත් අපිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිසා යම් කිසි දෙයක් කරන්න පුළුවන් නේද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා**

ගරු සභාපතිතුමනි.මේකට හොඳම විසඳුම අපි හැමදාම මෙතන සභාව තුළ කළ නොහැකි කාර්යයන් පිළිබඳව කතා කරනවා.ඩී.ඩී.සී එක තියෙනවා.මම මේ ප්‍රායෝගිකව ගත්ත දෙයක් ඉඹුලාන ඔබතුමා දන්නවා මම සේවා පියසක් හදන්න ඉල්ලීමක් කළා.මෙතැනට ඇවිල්ලා යෝජනා දන්වලා වැඩක් නැති නිසා ඩී ඩී සී එකට ඒ ලියුම ලිව්වා.ඔබතුමාටත් පිටපත් කරලා.ඩී ඩී සී.එකට ගිහිල්ල ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා.මේ වගේ ප්‍රශ්න අපි මහජන නියෝජිතයෙක් වශයෙන්.ඩී.ඩී සී.එකේ ලේකම්ට යැව්වා නම් අනිවාර්යෙන් ඒ සභාවට ගන්නවා.අපිට යන්න බැරි උනත් ගන්නවා.මගේ යෝජනාව අරන් මට ලියුමකුත් දීලා තියෙනවා.දැනට එල්. ආර් සී.ඒකට මේක දීලා තියෙනවා ක්‍රියාත්මක වෙමින් තියෙනවා කියලා එතකොට ඒක තමයි ප්‍රායෝගිකත්වය ආවොත් එතුමියගේ කතාව උනත් ඔබතුමිය ඩී ඩී සී එකට යොමු කරානම් ගරු සභාපතිතුමාට පිටපතක් එවල එතකොට ඔබතුමත් ඒ ගැන දැනුවත් වෙනවා.අපිට සහභාගි වෙන්න අවස්ථාවක් නැති හින්ද මේක තමයි වඩාත්ම හොඳ.මේක මම ප්‍රායෝගිකව දැක්ක හින්දා කියන්නේ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**

ඔබතුමාට සහභාගී වෙන්න පුලුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා**

ඔබතුමාගේ අනුමැතිය එතනට දැනුම් දෙන්න ඕනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම් . සිසිර කුමාර කස්තුරිසිංහ මහතා**

ගරු සභාපතිතුමාගෙන් සියලු මන්ත්‍රී තුමන්ලා තුමියන්ලාගෙන් අවසරයි.මම කතා කරන්න හිටපු කාරණාව ගැන ඔබතුමා යෝජනාවක් ගෙනාවා.උග්‍ර ජල හිඟය නිසා.වතුර පහසුකම් සපයන්න නමුත් සභාපතිතුමනි මම ඉල්ලීමක් කරන්න කැමතියි.අපි පුලුවන්නම් සාකච්ඡා කරලා මම සභාපතිතුමාට ඊයේ පෙරේදාත් කතා කළා.මළගෙයක් වෙලා ඒගොල්ලෝ වතුර ටිකක් ගන්න පුළුවන්කම තියෙනවද කියලා බලන්න.ඒක නිසා අපි ඔය මළගෙදරක් ඒ වගේම පොදු කටයුත්තක දී වතුර ටිකවත් දෙන්න අපිට ක්‍රමයක් තියෙනවා නම් අපිට හදා ගන්න අපහසු කාරණාවක් තමයි.ඒ වගේ දේවල් මිනිස්සු දිගින් දිගට කතා කරනවා.ඒ වගේම මම ගරු කොට්ඨාසයේ මන්ත්‍රීතුමිය මතක් කිරීමක් කරනවා.පුළුවන් නම් පොඩ්ඩක් බලන්න මට කීප දෙනෙක් කතා කළා.මේක චෝදනාවක් කරනවා නෙවෙයි.පාරේ වැඩ පටන් අරන් තියෙන නිසා අපහසුතා තියෙනවා වහලා ගොඩක් කල් කියලා.මම ඒකේ කම්පැණිය හරහා එන ටී ඕ ටත් කතා කළා.එයා කියනවා.ඉරිදා ඉඳන් පටන් ගන්නවා කොන්ක්‍රීට් එක දාන්න.කියල නමුත් පොඩ්ඩක් ගිහිල්ල මමත් යන්නම්. මටත් මේ දවස් ටිකේ ඉන්න හම්බ උනේ නෑ. පොඩ්ඩක් කතා කරලා වාහන යන්න විදිහක් නැහැලු.අපි චුට්ටක් ඒ ගැන බලමු මොකද හේතුව වැඩ කරනකොට අපහසුතාවය එනව.නමුත් ගම්වලින් දිගින් දිගටම කතා කරනවනේ කට්ටිය.ඉතින් ඒක නිසා ඒ සම්බන්ධව චුට්ටක් බලන්න කියලා ඔබතුමියගෙනුත් ඉල්ලා සිටිනවා.මමත් එන්නම්.ඒ වගේම තමයි මේ දවස්වල ගොඩක්ම ජල හිඟය තියෙනවා වැස්ස ආවොත් අපිට හොඳයි.නැත්තං අපි ඉන්න ප්‍රදේශයේ මම හිතන්නේ ඊයේ ගෝනගල ප්‍රදේශයට වතුර බෙදා හැරියා.යම් යම් අවස්ථාවලදී එම පහසුකම් සපයලා තිබිලා නැතුවහම තමයි අපිට කතා කරන්නෙ.වැඩේ ඉතිං අපි සභාවේ ඉන්න නිසා අපිට දිගින් දිගට කතා කරනවා කට්ටිය.උප සභාපතිතුමාටත් කතාකරන්න ඇති.මළගෙදර සම්බන්ධව අපි එහෙනම් ඒ ගොල්ලන්ව දැනුවත් කරන්න වෙනවා අපිට කරන්න කමක් නෑ කියනඑක. නමුත් ඒක අපි ඉස්සෙල්ලා එහෙම කියන්න කලින් සභාව දැනුවත් වෙලා ඉන්න ඕනේ.එහෙම කිව්වට පස්සේ එකත් ගැටලුවක් නෙ.මෙහෙම කරන්න ප්‍රතිපාදන නැහැ කියලා එකපාරම කිව්වම එයාලා ඊට පස්සේ වෙන කොහෙන් හරි කතා කරලා හරි ගත්තොත් අපි කිව්ව කතාව වෙනවනේ.ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න මම කැමතියි.බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.ඒ. උපාලි සිරිවර්ධන මහතා</u>**

ගරු සභාපතිතුමනි.මතුවෙච්ච පොඩි ප්‍රායෝගික ගැටලුවක්.මං මේ කතා කරන්නේ ඇත්තටම අපි සභාව තුළ කරුණු කාරණා සියල්ලම ව්‍යවස්ථාපිතව තමයි කටයුතු කරන්නේ.අපි උදාහරණයක් ගත්තොත් බලපත්‍ර සහිත ගහක් කපන්න රුපියල් දෙදාහක ඇප්ලිකේෂන් එකක් දෙනවා.බලපත්‍ර රහිත ගහක් කපන්න රුපියල් දාහක් ගෙවනවා .දැන් මට මනුස්සයෙක් ඇවිල්ල කතා කරපුහාම මම කිව්වා මේක තමයි ප්‍රොසීඩියර් එක.හැබැයි එයා වෙන එක්කෙනෙක් ගාවට ගියාට පස්සේ ලියුමක් දෙන්න මම සභාපතිතුමාට කියල කරගන්නම් කිව්වා.ඊට පස්සේ මට ඒ මනුස්සයා කියනවා.අනේ උපාලි මහත්තයා ඔයාට කරන්න බැරි දේ මම ලියුමක් දුන්න සභාපතිතුමා ලව්ව කරන්නම් කිව්වා.මට දැනගන්න ඕනේ සභාපතිතුමනි, ප්‍රොසීඩියර් එක මොකක්ද කියල.මම කරපු දේ වැරදිද අනිත් එක වතුර සම්බන්ධව. සභාපතිතුමනි වතුර සම්බන්ධවත් ඇවිල්ල මගෙනුත් ඉල්ලුවා.මම ඔහුට කිව්වා මේකේ තියෙනවා යම්කිසි ක්‍රමවේදයක්.ඒකෙ තියෙනවා ග්‍රාමසේවක වසමේ කමිටුවක්.මේකේ කමිටුවට ඉදිරිපත් කරන්න වතුර වලටත් කියලා තියෙනවා. වතුර වලටත් කියලා තියෙනවා ඉන්න මම බවුසරයක් සභාපතිතුමාට කියලා එවන්නම්.අපි නෛතිකව මේ දේ වෙන්න ඕනෑ කියලා කියනකොට.අනිත් මනුස්සයා එහෙම කියනකොට අපි එතැනදී ඒ මිනිස්සු හිතනවා මෙලෝ දෙයක් කරන්න බැහැ කියල.මේක එක ක්‍රමයකට යං.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනි.වතුර අවශ්‍යතාවයක් තියෙනවා ඒක අත්‍යවශ්‍යයි.ඒකෙ ඔය තියෙනවා.නියඟයක් ප්‍රකාශයට පත් කරන්නේ කොහොමද කියන එක.ඒ නියඟය ප්‍රකාශයට පත් කළාට පස්සේ තමයි බෙදන්න පුළුවන්කම තියෙන්නේ.දැන් අපේ එහෙම ප්‍රදේශ තියෙනවා ඊයේ වැස්සට.අපි වතුර බෙදන ප්‍රදේශ ටිකක් තියෙනවනේ.ඒ ප්‍රදේශවලට වැහැලා නෑ.ඇත්තටම වතුර නැනෙ.ජල සම්පාදනයෙන් වතුර දීලත් නෑ.කොහොමත් වතුර නෑ එහේ.එතකොට අපිට දීලා තියෙන අවස්ථාව තමයි එහෙන් අත්සන් ලේඛනයක් ගන්නවා අපි.වතුර බෙදනකොට ඊට පස්සේ සභාව සම්මත කරගෙන ආණ්ඩුකාරතුමියගේ අනුමැතියෙන් තමයි දෙන්න වෙන්නේ.පණත අනුව නම් ඉස්කෝල වලට පන්සල් වලට ආගමික ස්ථානවලට වතුර බෙදීමේ හැකියාවක් නෑ පනත අනුව.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා</u>**

ගරු සභාපතිතුමනි.පොදු වැසිකිළි මම බැලුවා.පිරිසිදු නැහැ.පිරිසිදුතාවය ගොඩක් අඩුයි.වතුර ලීක් වෙනවා.පෝච්චිය හොඳට පිරිසිදු නෑ.මේක ඇත්තටම වැසිකිළි පාවිච්චි කරන කෙනා තමයි කරන්න ඕනෙ.තමන් වැසිකිළි පාවිච්චි කරපුහාම වතුර දාලා පිරිසිදු කරන්න ඕනෙ.ඒක තමයි ප්‍රොසීඩියර් එක නමුත්.ඒක වෙන්නේ නෑ අද.ඒක වෙනස් වෙලා තියෙන්නේ පොඩි කාලේ ඉඳන් පුරුදු කරන්න ඕනේ ළමයින්ට.සභාවේ කටයුත්තක් විදිහට මේක ක්‍රමවේදයක් දාලා පිරිසිදු කරලා දුන්නොත් හොඳයි.පිට්ටනිය එකත් ඒ වගේ.ඒකත් මම බැලුවා.කාටවත් යන්න බැහැ.ඒගොල්ලෝ එතන ඉන්නවා සුද්ද කරන්නේ නෑ සල්ලි ගන්නවා.පිරිසිදු නැහැ. ඒ හින්දා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරලා මහජනතාවට යන්න පුළුවන් වෙන විදිහකට වැසිකිලි ටික හදලා දුන්නොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති ජේ.එම්.එච්. ජයවර්ධන මහතා</u>

මම හිතන්නේ අපි කලිනුත් සාකච්ඡා කළා. අපි ඕන කෙනෙක්ගේ පෞද්ගලික වශයෙන් මොනවා හෝ අකරතැබ්බ ආදියට මුහුණ දෙන්න පුලුවන්.ඒ හින්දා අපි මන්ත්‍රී සුබසාධනයක් හදාගන්න එක හොඳයි.අපි මේක කලින් සාකච්ඡා කළාට ක්‍රියාත්මක කරන්න බැරි වුනා.මම හිතන්නේ අද කාල වේලාවක් තියෙන හින්ද පොඩි සාකච්ඡාවක් කරගෙන සුබසාධක සංගමයක් හදා ගමු කියන යෝජනාව කරනවා.මීට කලින් හිටපු මන්ත්‍රී සහෝදර සහෝදරියෝ දන්නවා ඇති මේ සුබසාධනයක් පවත්වාගෙන ගිය විදිහ.ඉතින් අපේ ජෙෂ්ඨ මන්ත්‍රීවරයා වෙච්ච රත්නපාල පිරිස් මහත්තයාට.ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරලා මේක සක්‍රීය කර ගනිමු කියන යෝජනාව කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා</u>

ගරු සභාපතිතුමනි.අපේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගේ සංසන්දයක් හැටියට මේකේ හිටපු කණ්ඩායම ක්‍රියාත්මක වුණා.අපි ඒ දවස්වල රුපියල් තුන්සියක් තමයි මන්ත්‍රීතුමන්ලාගෙන් ගත්තෙ.මන්ත්‍රීතුමෙක්ගේ ගෙදරක මළ ගෙදරක් වුණොත්?පවුලේ සාමාජිකයෙක් මළගෙදරක් වුනොත් එහෙම නැත්නම් හදිසි ආපදාවක් වුණොත්.මේකෙන් යම් මුදලක් දෙන්න ඊට පස්සේ.මේ ධූරකාලය ඉවර උනහම අපි කළේ අර ආධාර ගත්ත මන්ත්‍රීතුමන්ලා අතැරලාඅනිත් අය අතරේ ඉතුරු මුදල සමසේ බෙදලා දුන්නා.ඒ විදිහටයි කලේ.මම හිතන්නේ මේක මන්ත්‍රීවරු හැටියට ගෙදරක සමහර වෙලාවට කරදරයක් සිදු වෙන වෙලාවට සතපහ නැතිවෙන්න පුළුවන්.ඒ වගේ වෙලාවට අපිට මේක හයියක් වෙනවා.ඊළඟට අපි මන්ත්‍රීවරු ගිහිල්ල නිකං ගිහින් කතා කරලා එනවට වඩා සුබ සාධක සමිතියක් විදිහට මේක.හදාගන්නවා නම් අපිට ලොකු සහනයක් වෙනවනෙ.ඉතින් මේක මම හිතන්නේ වැදගත් වෙනවා කියන එකයි මේකේ සභාපතිතුමා නිල බලයෙන්ම අපි යොදාගෙන හිටියේ.අපේ සභාපතිතුමා එතකොට අපි මාසිකව ඒ දවස්වල රුපියල් තුන්සීයයි ගත්තේ දැන් රුපියල් පන්සීයක් ගත්තත් කමක් නෑ.ඒ නිසා දෙන මුදල අයකර ගන්න මුදල.මේ වගේ පොඩි සාකච්ඡාවක් කරලා අපි මේ සුබසාධක සමිතිය හදා ගමු කියන එකයි අදහස.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.එම්. ශ්‍රී සාන්ති කුමාරි දිසානායක මෙනවිය</u>

ගරු සභාපතිතුමනි මන්ත්‍රීතුමන්ලාගේ අර ගමන් වියදම් ඒකට මොකද වුනේ.

<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>

අපි ඒක තීරණය කලානේ ගරු මන්ත්‍රීතුමිය පළාත් පාලන කොමසාරිස් හරහා ආණ්ඩුකාරතුමියට යවන්න.හදලා තියෙන්නේ යවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.එම්. ඉන්ද්‍රානි කුසුමලතා මහත්මිය</u>

ගරු සභාපතිතුමනි,මම හිතන්නේ මම මේ සභාවට ආපු කාලේ ඉඳලා ඉල්ලුවේ.තලවත්ත පන්සල හරහා එතනින් යන දුම්බුලුව නාරන්ගස්තැන්න පාර බෝක්කුව කැඩිලා කියලා පන්සල පටන් ගන්න හරියෙම.දැන් ඒක හොඳටම අබලන් වෙලා තියෙනවා.මම හිතන්නේ අපේ මන්ත්‍රීතුමාටත් ඒක දැනුවත් කරන්න ඇති කට්ටිය.නමුත් එතැනින් එහාට විකල්පයක් යෙදුණේ නම් නැහැ.හාමුදුරුවොත් හැමෝමත් කතා කරලා කියන්නේ වාහනයක් යන්න බෑ. එතන වළවල් දෙකක් හැරිලා.ගෙවල්වල තියෙන සිමෙන්ති කොට්ටයක් දෙකක් ගෙනල්ලා ඒක යන්තම්

ප්‍රතිසංස්කරණය කර ගත්තා.ඒ ගැන කතාකරලා ඉක්මනට මොනවා හරි සකස් කරලා දෙන්න ඕනේ කියන එක මතක් කරනවා.යෝජනාවක් විදිහට ගේනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එන්. අරුන ශාන්ත වීරසේකර මහතා</u>**

ගරු සභාපතිතුමනි,ප්‍රතිපාදන වෙන් කරන්න කියලා ඉල්ලීම කරලා තියෙනවා.ප්‍රජා ශක්ති එක හරහා.ක්‍රියාත්මක වෙන්න මුදල් එන්න ඕනේ.මුදල් ආපුහාම ඉක්මනට ක්‍රියාත්මක කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී. රත්නපාල පීරිස් මහතා</u>**

ගරු සභාපතිතුමනි.විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනේ අඟුරුවැල්ල නගර සීමාව තුළ මේ වෙනකොට මරණ කිහිපයක්ම සිද්ධ වුණා.එතකොට මේකට ඒ ප්‍රදේශවාසීන් දරන මතයක් තියෙනවා.නගරය තුළ දැනට යොදලා තියෙන විදුලි එලිය ප්‍රමානවත් නෑ කියන එක.මේක විශේෂයෙන්ම බලපාන්නේ ගල්පාත හන්දියට ඇත ඉඳලා එනකොට අඳුරුයි කෙනෙක් ළඟින් මාරු වුනොත් රියදුරා දකින්නේ නෑ කියන මතයත් එක්කයි මේ මතය සමාජගත වෙලා තියෙන්නේ.ඊළඟට ඒ නිසා අර සුදු ඉර පේන්නේ නැහැ.ඉතින් ඒ නිසා අඟුරුවැල්ල නගරයේ සිදුවන රිය අනතුරු සංඛ්‍යාව ඉහල ගිහිල්ලා තියෙනවා.ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරන්නේ අපේ කාර්මික කමිටුවේ සභාපතිතුමත් ඉන්නවා.දැනට තියෙන විදුලි බුබුළු වලට වැඩි ධාරිතාවයකින් යුත් විදුලි බුබුළු යොදලා ගල්පාත හන්දිය ඒ ටිකට විදුලි බුබුළු සවිකරන්න ක්‍රමවේදයක් තියෙනවා නම් මම හිතන්නෙ හොඳයි මේ තියෙන අවදානම් තත්ත්වයෙන් අපිට එන යම් දෝෂාරෝපණය යම් තරමකට අවම කරගන්න පුළුවන් කියන එකයි මම විශ්වාස කරන්නේ.ඒ නිසා අපි මේ අඟුරුවැල්ල නගරය ආරක්ෂිත නගරයක් කරන්න කටයුතු කරමු කියන ඉල්ලීම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් හැටියට කරනවා.ඊළඟ කරුණ ගැන විතරයි මතක් කරන්නෙ.දැන් අලුත් ගැසට් එක අනුව සාම විනිසුරුවරුන් හතළිස් එක් දාහක් තනතුරු අහිමි වෙනවා. දැන් ඉස්සර ගැසට් එකක් තියෙනව.ඉස්සර කළේ යම් තනතුරක් දීපුවාම ක්‍රමවේදයේ යම් යම් දුර්වලතා තියෙනවා.නමුත් මේ තනතුරක් දෙන්නේ පුද්ගලයෙකුට ගෞරවනීය එකක් එක්කලා දෙන්නෙ.නමුත් දැන් මේ සීමාව හැත්තෑවෙන් නවත්වන්න හදනවා.වයස අවුරුදු හැත්තෑවෙන් නතර කරනවා.එතකොට සාම විනිසුරුවරයෙක් හැටියට කටයුතු කරන්න තියෙන අවස්ථාව ගමේ ඒකට යන්න පෙළඹුණේ යම් සමාජ සේවා කරලා.එහෙම නැත්තං කැපවීම් කරලා නායකත්වය දීල මග පෙන්වලා එහෙම අය එහෙම අයටත් මේක නැති වෙනවනෙ.ඒ නිසා මේක සමස්තයක් හැටියට කල්පනා කරලා බලලා ඉල්ලීමක් කරන්නේ සභාපතිතුමාට යම් සාකච්ඡාවලදී මේක ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබෙන්න පුළුවන්.එහෙම ලැබුණාම මේ නීතිය අඩු ගානේ තව ටිකක් එහාට වයස ගන්න පුළුවන්ද කියල අනිත් එක තව ප්‍රශ්නයක් තියෙනවා සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට සාමවිනිසුරු හැටියට ලැබෙනවා නිල බලයෙන්.දැන් අර නීතිය අනුව හැත්තෑවට වැඩි නම් ඒක ලැබෙන්නේ නැහැනෙ.ඒක සමස්තයක් හැටියට සලකලා බලලා වයස් සීමාව එක්කො ඉහල දාන්න.එහෙම නැත්තං වයස් සීමාව කියන එක අයින් කරලම දාන්න .මේ ක්‍රමවේදය තුළ සාමවිනිසුරු ගමේ ගෞරවනීය සේවයක් කරපු මිනිස්සු නිකම්ම නිකම් මිනිහෙක් කියනවා. අපචාර මේ සිද්ධියක් වෙනවා නම් වැරුද්දක් කරනවානම් ජේ.පී කම අහිමි කරලාම දාන්න ඕනෙ.සමාජමය පිළිගැනීමක් නැනෙ තනතුරට ගෞරවයක් නැනෙ. අද දවසේ හතළිස් එක් දාහ වුණත් හෙට දවසේ අපි ඔක්කොම ඒ නිසා මේ ගැනත් විශේෂ අවධානය යොමු කරමින් මම නවතිනවා. ස්තුතියි.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා.එක එහෙම නෙවෙයි.ඒක වෙලා තියෙන්නේ අවුරුදු 70 පස්සේ සාම විනිසුරු පදවියක් දෙන්නේ නැහැ.තියෙන අයගේ අහෝසි වීමක් නෙවෙයි.ඒක සන්නිවේදනයේ දුර්වලතාවක් කියලා කියන්නෙ.ඒ පණිවිඩේ ගිහිල්ල තියෙන වැරැද්දක් කියලා කියන්නේ අවුරුදු හැත්තෑවෙන් පස්සේ ඒ තනතුර දෙන්නේ නෑ කියන එක අලුතෙන් තියෙන ඒවා අහෝසි වෙනවා කියලා එකක් නැහැ.ඒක ඉල්ලන්න එපා වගේ අදහසක් කියන්නෙ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. කමල් දේශප්‍රිය මුණසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමනි.ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා රත්නපාල පීරිස් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ අඟුරුවැල්ල නගරයේ ඇත්තටම ඒක කාලීන ප්‍රශ්නයක් වෙලා තියෙනවා මෑත කාලීනව එම ස්ථානයේ අනතුරු ගණනාවක් සිදු වුණා. අපි දන්නවා අඟුරුවැල්ල ප්‍රධාන බස්නැවතුම්පොළ දෙපස තියෙනවා.ලයිට් කණු දෙකක්.ඒ දෙකේ බල්බ් හතරක් තියෙනවා.එළිය ගත්තහම වෝල්ටේජ් එක ගත්තාම සාමාන්‍යයෙන් පාරවල් වලට දාලා තියෙන එළිය ලයිට් හතරක් තමයි තියෙන්නෙ.ත්‍රිරෝද රථ සංගමයත් අවස්ථා කිහිපයක දී කිව්වා.ප්‍රධාන මාර්ගයේ සුදු ඉර පදිකයන් මාරු වෙන සුදු ඉර තියෙන්නේ හරියටමමේ කණු දෙක මැද.ඒ අතර ඒක උඩ දී දැන් සති දෙකකට විතර උඩදී කන්නත්තොට ත්‍රිරෝද රථයක හැප්පිලා පුද්ගලයෙක් මිය ගියා.මේ ඉතාමත්ම මෑත කාලීනව ඒ වගේම රත්නපාල පීරිස් මහත්තයා ප්‍රකාශ කළා වගේ අඟුරුවැල්ලෙන් ගල්පාත හන්දියට හැරෙන ස්ථානය හවස හයෙන් පස්සේ පහත් හයත් හතත් අතර කාලයේ විශාල වාහන ප්‍රමාණයක් ගල්පාත මාර්ගයට ප්‍රවේශය ගන්නව.මෙම ස්ථානයේ විදුලි ආලෝකය ඇත්තටම ප්‍රමාණවත් නැහැ.ඒක නිසා මේකට කඩිනමින් අපි විසඳුමක් ලබාගන්න ඕනෙ කාර්මික කමිටුවේ සභාපතිතුමාටත් මේ ස්ථානයේ ඉන්න අපි ඉල්ලීමක් කරනවා.ඒ සඳහා අපි එතනට තව ලයිට් ඒ එළියට වඩා වැඩි වෝල්ටේජ් එකක් තියෙන බල්බ් භාවිතා කරන්න පුළුවන් නම් එම ස්ථානය ආලෝකමත් කර ගන්න ඒ සඳහා අවශ්‍ය කටයුතු කරලා දෙන ලෙස බොහොම කාරුණිකව ඉල්ලා සිටිනවා.ඒ වගේම විශේෂ ස්තුතියක් මේ අවස්ථාවේ සිදු කරන්න ඕනේ.2026.02. 22 නිවාස සහ ප්‍රජා සංවර්ධන කාරක සභාවේ කමිටුව විසින් තීරණය කරගත් පරිදි 2026.02.27 වන දින වරාවල පරණ පාලම දෙපස අධික ලෙස කැලෑ වැහිලා තිබුනේ.සකාෆ් මන්ත්‍රීතුමාගේ ප්‍රධාන මැදිහත්වීමෙන් ඒ ස්ථානය ආර් ඩී එකේ ඉල්ලීම පරිදි බැකෝ යන්ත්‍ර යොදලා ශුද්ධ පවිත්‍ර කළා.නමුත් මීට පෙරත් එම ස්ථානයේ ප්‍රාදේශීය සභාවෙන් ගහලා තියෙනවා කසළ දැමීම සම්පූර්ණයෙන් තහනම් කියල මේ වනවිටත් අධික ලෙස මෙම ස්ථානයේ කසල බැහැර කිරීම සිදුවෙනවා.විශාල දුර්ගන්ධයක් තියෙන්නේ විශේෂයෙන්ම රිටිගහඔය ඒවගේම.1897 ඉදිකරන ලද ලංකාවේ තියෙන පැරණිතම දුනු පාළම මෙම ස්ථානයේ සංචාරක ආකර්ශනයක් තියෙන තැනක් මේ ස්ථානය මෙහෙම කැලෑ වැදිලා තිබුණහම.විශාල අපචාර ප්‍රමාණයකුත් සිදුවන තැනක්.අපි දන්නවා බොහෝ කණ්ඩායම් එම ස්ථානයට විවිධ මත්ද්‍රව්‍ය අරගෙනත් එනවා.මේක අපි සුද්ද පවිත්‍ර කරන්න ශ්‍රමදානයක් යොදාගත්තා.ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.විශේෂයෙන්ම ශ්‍රමදාන වැඩසටහන සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සහය ලබා ගැනීම ඇත්තටම සමන් ඉන්දික දයාරත්න මැතිතුමා මේකට ප්‍රධාන වශයෙන් දායකත්වය අරගෙන ලිපියත් අරගෙන ආර් ඩී එකට ගිහිල්ල ලබාදුන්නා .ආර් ඩී එක පහුවදාම එතැන ප්‍රතිචාර දක්වලා අපිට සේවක මහතුන් පිරිසක් එව්ව උපකරණත් එක්ක.එම නිසා එම ස්ථානය අද වන විට හොඳින් සුද්ද පවිත්‍ර කරලා තියෙනවා මේ අවස්ථාවේදී ආර් ඩී එකට අපගේ ස්තුතිය පිරිනමනවා.මේ කටයුත්තට මැදිහත් වෙලා සභාපතිතුමාගේ අත්සනින් යුතුව ලිපියක් නිකුත් කරලා විශේෂයෙන්ම රාජ්‍ය ආයතනයක් අධිකාරියක් වශයෙන් එම ආයතනයේ සහය ලබා ගැනීමට අපට ඒ කාර්ය කරගැනීමට හැකියාව ලැබුනා ඉතින් ස්තුතිය පළ කරමින්.මා මේ අවස්ථාවේදී නිහඬ වෙනවා.බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>

ගරු සභාපතිතුමනි. 2025 දී සභා අරමුදල් සියලු මන්ත්‍රීවරුන්ට ලැබුණේ නැහැ.2026 වර්ෂයේදී සභාපතිතුමනි, සභා අරමුදල් සියලුම මන්ත්‍රීවරුන්ට ලැබෙනවා නම් ගොඩක් හොඳයි මොකද යටියන්තොට අපේ අල්ලපු ආසනේ සෑම මන්ත්‍රීවරයෙකුටම සභා අරමුදල් ලැබිලා තියෙනවා.ඇයි අපේ සභාවේ විතරක් අපි සමගියෙන් ඉන්නේ. මම කියන්නෙ අනිත් සියලු මන්ත්‍රීවරුන්ට ලැබෙනවා නම් ගොඩක් හොඳයි.ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි අනවසර ඉදිකිරීම ඉවත් කරන්න යෝජනාවක් ගෙනාවා ගිය පාර මම හිතන්නේ වැඩි ඡන්දයෙන් සභා සම්මත වුණා අපි විරුද්ධ වුණත් අපිට පේනවා එදා කිව්වා ගිය ආණ්ඩු වලින් හදපුවා කියලා.හැබැයි ගිය ආණ්ඩු වලින් විතරක් නෙමෙයි ගරු සභාපතිතුමනි මේ ඔබතුමාලගේ ආණ්ඩුවේත් ඒ වගේ දේවල් වෙනවා. එතකොට අපි මේ අහිංසක මිනිස්සු කවුරු හරි කෙනෙක් සභාපතිතුමනි මාර්ගයක් අයිනට ඇවිල්ලා එක කඩයක් ඉදිකරනවා.ඉස්සරලාම ලෑලි වලින් ඉදිකරනවා.ඊට පස්සේ ඒක ස්ථිරව ඉදිකරනවා.තවත් රැයක් එළි වෙනකොට ඒක දැකලා තවත් කෙනෙක් ණයක් හරි අරගෙන නැවතත් පාර ගාවට ඇවිල්ල නැවත කඩයක් ගහනවා.ඒක දැකලා තවත් කෙනෙක් ඉදිකරනවා.අපි මාර්ග වල යනකොට පේනවා.කඩ මම හිතන්නෙ තිහ හතළිහක් අලුතින් ඉදි වෙනවා.ඊට පස්සෙ අපි තීරණයක් ගන්නවා හදලා ඉවර උනාට පස්සේ කඩලා ඉවත් කරන්න අපි ඊට ඉස්සරින් අපි මේ මාර්ගවල යනකොට අලුතෙන් ඉදි කරනවා නම් ඒවා නවත්තන එක තමයි ගරු සභාපතිතුමනි විය යුත්තේ.නැත්නම් අර අහිංසක මිනිස්සු හිතන්නේ මේක කඩන්නේ නැහැ කියලනෙ අරය ඉදිකරනවා.ඒ හින්දා

මමත් ඉදිකරනවා.කියලා දිගටම කඩ ටික ඉදිකරගෙන යනවා.නමුත් මම කියන්නෙ ගරු සභාපතිතුමනි,ඒවා කඩා ඉවත් කරනවා නම් ඒවා හදන්න ඉස්සරින් එක දවසෙන් හදනවා නෙවෙයිනේ. එතකොට අපි ඒවා ඉවත් කරනවා කියන එකට වඩා කලින් කියන එක සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

අපි හදන්න දීල නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>**

දිගටම හදනවා සභාපතිතුමනි.හදල ඉවත් කරන එක නෙවෙයි මම කියන්නෙ.ඉවත් කරනවා නම් හදන්නඉස්සරවෙලා කියන්න.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**
කොහෙද හදලා තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ ඉන්දික ජයලත් වේරගොඩ මහතා</u>**

මෙතනින් පටන් ගත්තහම පාර දිගටම සුසන්ත මන්ත්‍රීතුමා දැක්කා නේද.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සුසන්ත ප්‍රියන්ජිත් මහතා</u>**

කණු හතරක් හදල ඉවරවෙලා පොඩි .තාවකාලික වහලක් ගහලා තැඹිලි වගේ දේවල් තියෙනවා.දෙකක් විතර.මේ වෙනකොට ආර්.ඩී එකෙන් ඇවිල්ලා ඒ ගොල්ලන්ට ඉවත් කර ගන්න කියලා තියෙනවා.

**<u>ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා</u>**

ස්ථිරව හදපුවා නැනේ.කොතනද හදලා තියෙන්නේ නිශ්චිතව කියන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. චූලංග අනුපිය අධිකාරී මහතා</u>**

ගරු සභාපතිතුමනි.විශේෂයෙන් කතා කරන්නේ පහල දන්නොරුව මාර්ගය ගැන.මම ඉස්සර වෙලත් කියලා තියෙනවා.ග්‍රාම නිළධාරි ඉන්නේ කිලෝමීටර් දහයක් විතර යන්න ඕනෙ රුවන්වැල්ලට ඇවිදින්.ඉතින් ඒක හින්දා අතුරු මාර්ගයක් තියෙනවා.දන්නොරුව දෙණිපල්ල කියල.දන්නොරුව දෙණිපල්ල අපේ නිමල් මහත්තයලාගේ ගෙවල් පාර.ඒ කාලේ මම කොන්ක්‍රීට් යම්කිසි ප්‍රමාණයක් දාලා තියෙනවා තව මීටර් පන්සීයක් හයසීයක් තියෙනවා.ඒක දාගත්තොත් අපිට යන්න එන්න ලේසි වෙනවා එහා පැත්තෙන් නාය ගියහම එහෙම හුඹස්වලාන පැත්තෙන් ඔතනින් තමයි යන්නේ .දැන් නම් වාහනයක් යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ.ඒ වගේම වැද්දෑවල පාරේ තියෙනවා. දැනට ඒ පාර නාය ගිහිල්ලා පුපුරලා තියෙනවා.ඒ කට්ටියටත් මේ මාර්ගයේ යන්න පුළුවන්.ඒ වගේම ඇවිදිල්ලා අතුරු මාර්ගය එන්න පුළුවන්.ඒ හින්ද අතුරු මාර්ගය ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන දීලා හරි ඒක කරනවා නම් හොඳයි.මේ සැරේ ප්‍රතිපාදන ටිකක් මන්ත්‍රීතුමත් අපි දෙදෙනාම එකතු වෙලා ලිපියක් දෙන්නම් ප්‍රතිපාදන ටිකක් ඒ ප්‍රදේශයට දෙන්න.ඒක දුන්නොත් මම හිතන්නේ ප්‍රදේශයට ජනතාවට කරන ලොකු සේවයක්.ඒ වගේම හුඹස්වලාන පැත්තෙන් තියෙනවා වැවල මාර්ගය කියලා.ඒකත් ඉතාම කෙටි මාර්ගයක් අපේ ගරු උපසභාපති තුමාලාගේ පැත්තක් සම්බන්ධතාවයක් තියෙනවා වැවල හරහා පාරේ හැදුවොත ඒකත් මම හිතන්නේ ඒ ප්‍රදේශයට කරන ලොකු සේවයක්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. නිමල් විජේසේකර මහතා</u>**

අධිකාරී මන්ත්‍රීතුමා ඉස්සර සභාවේ ඉන්න කාලේ ඒ පාර ගොඩාක් දුරට හදලා දුන්න.ඒකට ස්තුති වන්ත වෙනවා ඇත්තටම.පරාක්‍රම අතාවුද මහත්තය ඉන්න කාලේ හදල දුන්න .දැන් ඒ ගං දෙක යා කරන පාරක් තියෙනවා ඒකට ලියුමක්තමා අද ග්‍රාම සංවරඒධන සමිතියෙන් දුන්නෙ බැකොඑක ඉල්ලලා. ඒ පාර කපා ගන්න.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී. සුදත් හේමන්ත මහතා__

ගරු සභාපතිතුමනි.විශේෂයෙන් මම ඉතා සංවේදී කාරණාවක් මතුකරන්නේ.සියලු දෙනාගේ අවධානය යොමු කරන්න මම නැගී සිටියේ.ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ මහදෙනිය වසම සහ බටහිර ගෝනගල වසමට බලපැම් වෙන විදිහේ ගල් වැඩපළක් එහෙම නැත්නම් ගල් කොරියක් පවත්වාගෙන යනවා.පසුගිය දහවැනිදා ඒකේ කාලය දීර්ඝ කිරීමට අදාළව පරීක්ෂණ පිපුරුමකුත් කලා.මමත් එතනට සම්බන්ධ වුණා.මේක ජනාධිපතිතුමාට යනකම් පැමිණිළි කරල තියෙනව.නායයෑමේ අවදානමක් විශේෂයෙන් නැගෙනහිර බෑවුම් බටහිර ගෝනගල වසමට අදාල වෙන කොටසේ නායයෑමේ අවදානමක් තියෙනවා කියලා ලේකම්තුමා මට හදිසියේ කිව්වා.මෙන්න මෙහෙම එන් බී ආර් ඕ එකෙන් ඇවිදින් තියෙනවා.ඒක පුළුවන් නම් සම්බන්ධ කරලා දෙන්න ඒකට විරුද්ධ පාර්ශ්වය කියල.පස්සේ මම ඒකට විරුද්ධ පාර්ශවයේ කිහිප දෙනෙක් හොයලා එම් බී ආර් ඕ එකේ නිලධාරීන් හම්බවෙලා කතා කරපුහාම ඒ ගොල්ලො කියා සිටියේ ගල් වැඩපලේ බලපත්‍රයේ දීර්ඝ කිරීමට අදාළව ඒ ගොල්ලෝ ඇවිල්ලා තත්වය බලලා දෙනවා කියලා .අනුමැතිය මම ඇහුවා ඒ ගමන අනුමැතිය දෙන්නේ දෙපැත්තම බලලද කියල එතකොට සාමාන්‍යයෙන් අපේ තියෙන එම් බී ආර් ඕ එකේ තියෙන ක්‍රමවේදය තමයි ඒකට අදාළ ශාස්තු ආයතනයේ ගත්තහම ඒ පැත්ත බලලා දෙනවා එතකොට අනිත් පැත්තේ නැගෙනහිර බෑවුමට වෙන බලපෑම පිළිබඳව තක්සේරුවක් නැති එක පිලිබඳව මේ සභාවේ අවධානය යොමු කරන්න හේතුව කර්මාන්ත පවතිනවා.මම එදා ආයතන ප්‍රධානියත් එක්ක ගිහින් කතා කළා.මේ රටේ ගොඩනැගිලි අවශ්‍යතාවයට අවශ්‍ය කළුගල් ලබා ගැනීමට කර්මාන්ත පැවතිය යුතුයි.නමුත් ඒ කර්මාන්ත ජන ජීවිතයට හා පරිසරයට හානි වෙනවා නම් කර්මාන්ත පැවතිය යුතුද කියන එක පිළිබඳව අපි නැවත වරක් සිතා බැලිය යුතුය.විශේෂයෙන් ඒ සම්බන්ධයෙන් ඒ පාර්ශ්වයත් එක්ක සාකච්ඡා කරද්දි මට දැනුණේ අපේ කස්තුරි මන්ත්‍රීතුමත් ඕක දන්නවා කලින් තිබිලා තියෙනවා ඓතිහාසික ස්ථානයක්. සුද්දන්ගේ කාලේ පරණ බංගලාවක්.ඒ බංගලාව මුලින්ම කඩා ඉවත් කරලා තමයි මේ ගල් වැඩපල ආරම්භ කරලා තියෙන්නේ. හේතුව අවුරුදු සීයකට වැඩිය පරණ බොහොම අලංකාර බංගලාවක්.ඒක අවුරුදු සීයකට වඩා පරණ උනාම අපි දන්නවා.පුරාවිද්‍යාත්මක අනුමැතිය ගන්න බැහැ.ඒක පුරාවිද්‍යාවට යනවා කියලා.එහෙම තමයි මේකේ ආරම්භය අරන් තියෙන්නේ.ගමේ මිනිස්සුන්ගේ කතාවට අනුවත් කියන්නේ මේකේ නිධානයක් තිබ්බා. ඒක නිසා ගල් වැඩපළක් දැම්මා.කියල මහා විශාල වැඩපළක් කර්මාන්තය පිළිබඳ ගැටළුවක් නැති වුණත් ජන ජීවිතය පිළිබඳව අපට වගකීමක් තියෙන නිසා සභාවෙත් අවධානය යොමු කරනවා.පරීක්ෂණ පිපිරුම් සභාවටත් මම ලිපියක් යොමු කරලා තියෙනවා මම සම්බන්ධ වෙන්නෙත් අහම්බෙන් සභාවේ නියෝජිතයෙක් සම්බන්ධ වුණේ නෑ ඒ වෙලාවේ නිලධාරියෙක්.ඒක නිසා විශේෂයෙන් අපිට නැවත වටයකින් බටහිර ගෝනගලට තියෙන නාය යෑමේ තර්ජනය පිළිබඳව නැවත වටයකින් අපිට ගන්න වෙනවා තක්සේරුව.ඒ අනුව තමයි මේ කියන ස්ථානයේ පවත්වාගෙන යනවාද නැද්ද කියන එක තීරණය කරන්න වෙන්නේ නැහැ.හැබැයි මේ වෙනකොටත් ඒ අදාළ පිපුරුම වාර්තා අනුව ඔවුන්ට හම්බවෙලා තියෙනවා බලපත්‍රය.එතකොට ඒ පිපුරුම පරීක්ෂාවේදී ගොඩක් වෙලාවට කරන්නේ එයා ප්‍රෙෂර් එකක්.පොළොවේ තියෙන කම්පනයක් තමයි ගණනය වෙන්නේ.එතකොට මට නිරීක්ෂණය වෙච්ච දේ තමයි වායුව දූෂණය වෙන්න.වායුගෝලයේ බලපෑමට වෙන හානිය පිළිබඳව ඒ පරීක්ෂණයේදී ගණනය වීමක් නැහැ.ඒ වගේම තමයි මිනිස්සුන් කියා සිටින්නේ ඒ පිපුරුම පරීක්ෂණ පිපුරුම මිනිස්සුන්ට නොදැනෙන්න කලාට සාමාන්‍ය ක්‍රමය යද්දී ඊට වඩා වැඩි බෙහෙත් ප්‍රමාණයක් හෝ වැඩි විශාල කම්පනයක් සහිත පිපුරුම් කරනවා කියලා.එතකොට සාමාන්‍ය ක්‍රමවේදය එහෙමනෙ වෙන්නේ ඒක නිසා මම ඒ ආයතනයටත් බලපත්‍ර දෙනවා ආයතනයටත්.මට කලහැකි දේ උනේ මම ඉල්ලා සිටියේ පුලුවන්නම් කමිටුවක් දෙන්න මට අපක්ෂපාතී මිනිස්සු කීපදෙනෙක් කමිටුවකින් නිරීක්ෂණය කර ගන්න හේතුව මිනිසුන්ට නිලධාරීන් පිළිබඳව දේශපාලඥයා පිළිබඳව කර්මාන්තකරුවා පිළිබඳ ලොකු පැහැදීමක් තාම හැදිලා නෑ.අපට අවශ්‍යතාවය තියෙන්නේ නිලධාරීන් පිළිබඳව කර්මාන්ත පිළිබඳව හා දේශපාලකයා පිළිබඳ යහපත් චිත්‍රයක්.මේ රටේ හදන්න ඕනේ. නැතුව මේ රට ඉදිරියට ගෙනියන්න බෑ.ඒ නිසා සභාවක් හැටියට සභා බල ප්‍රදේශයේ තියෙන කර්මාන්ත ශාලාවක් නිසා මීට වඩා සාධනීය මැදිහත්වීමක් කරන්න සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා.ඉදිරියේදී මේ තත්වය බලලා මේ කියන නායයෑමේ අවදානමක් තිබේද නැද්ද ඒකට බලපාන්නේ මේ කර්මාන්තය ද නැද්ද කියන තක්සේරුවකට අපිට

එන්න අදාළ ආයතන දැනුවත් කරලා අපි සභාවත් හැටියට තොරතුරු අරගෙන ඉදිරියට ක්‍රියාත්මක වෙමු කියන ආරාධනය මම කරනවා.එයින් පීඩා විඳින ජනතාව වෙනුවෙන්.

**ගරු සභාපති ඩබ්.එච්.එම්.පී.දර්ශන වෛද්‍යරත්න මහතා**

සභාවේ කටයුතු අද දවසේ මෙතනින් අවසන් කරමු.

ඒ අනුව මධ්‍යාන 12.00 පමණ ගරු මහ සභාවේ කටයුතු අවසන් කෙරුණි.